

වාර්ෂික වාර්තාව 2017

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය



ආයතනය	-	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
අමාත්‍යාංශය	-	නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු
ලිපිනය	-	"නිපුණතා පියස" නො. 354/2 ඇල්විටිගල මාවත. නාරාහේන්පිට. කොළඹ 05.
ඊ මේල් ලිපිනය	-	info@vtasl.gov.lk
වෙබ් අඩවිය	-	www.vtasl.gov.lk
විගණකවරු	-	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
බැංකුකරුවන්	-	මහජන බැංකුව

පටුන

දැක්ම හා මෙහෙවර	1
කාර්යයන්	2
පිළිගැන්වීම	3
හැඳින්වීම හා ව්‍යුහය	4
පාලක මණ්ඩලය	4 - 5
පාලක මණ්ඩලයේ වාර්තාව	6 - 9
ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය	10 - 11
කාර්යය මණ්ඩල සංයුතිය	12 - 14
කාර්යය මණ්ඩලය පුහුණු කිරීම	15
වෘත්තීය පුහුණුව ලබාදීම	16 - 18
පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය	19 - 21
වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම හා ඇගයීම්	22
වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය	23
රැකියා ස්ථාපනය	23 - 25
රාජ්‍ය හා පෞද්ගලික ආයතන එක්ව සිදුකල වැඩසටහන්	26
ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	26
අභියෝග	27



■ දැක්ම ■

ගෝලීය රැකියා වෙළෙඳපොල අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලංකාවේ ක්‍රියාශීලී හා නිර්මාණශීලී වෘත්තීය පුහුණුව සපයන ප්‍රමුඛතම ආයතනය වීම.

■ මෙහෙවර ■

වෘත්තීය පුහුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නවීන ක්‍රමවේදයන් හා තාක්ෂණයන් මගින් පුද්ගලයන් තුල නිපුණත්වයන් සංවර්ධනය කරමින් ගෝලීය පුහුණු ශ්‍රම ඉල්ලුම සපුරාලීම පිණිස පහසුකම් සැලසීම අපගේ සේවාවන් හා පහසුකම් ඉහලම ප්‍රමිතියක තබා ගනිමින් හා ජාත්‍යන්තර රැකියා ප්‍රවණතාවයන් ඉලක්ක කර ගනිමින් අපි මෙම මෙහෙවර සාක්ෂාත් කර ගන්නෙමු.

■ කාර්යයන් ■

- වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම හා බාහිර ආයතන ද සම්බන්ධ කර ගනිමින් තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව හා නිපුණතාවය ලබා දීම.

- නිපුණතා පාදක අවසන් ඇගයීම් පැවැත්වීම, ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම, වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම හා වාර්තා නිකුත් කිරීම.

- ජාතික වෘත්තීය පරීක්ෂණ හා අවසන් පරීක්ෂණ පැවැත්වීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීම.

- වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් මෙහෙය වීම.

- වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා උපදේශන ලබා දීම.

- වෘත්තීය පුහුණුව ලැබූ තරුණ පිරිසට වැඩිදුර පුහුණුව ලබා දීම, රැකියාගත කිරීම සහ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

පිළිගැන්වීම

සීතා අරඹෙපොළ මැතිතුමිය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

"නිපුණතා පියස"
නො. 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව - 2017
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනතේ 25 වන වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)C වගන්තිය ප්‍රකාරව 2017 වර්ෂයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙයට
විශ්වාසී,

දමිත වික්‍රමසිංහ
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

හැඳින්වීම හා ව්‍යුහය

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපිත කරන ලදී.

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනතේ 5 වන වගන්තියට අනුව පත් කරනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ඇතුළු සාමාජිකයන් 10 දෙනෙකුගෙන් හා පෙර පත්වූ 11 දෙනෙකුගෙන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාලක මණ්ඩලය සමන්විතය.

2017.05.19 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

- මේජර් ජනරාල් ගාමිණි හෙට්ටිආරච්චි
  මහතා සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී. රණතුංග
  මහතා අධ්‍යක්ෂ
  භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව
- අචාර්ය ජයන්ත බාලසුරිය
  මහතා නියෝජ්‍ය අධ්‍යාපන
  අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්
  අංශය)
- ඇන්ටන් පෙරේරා මහතා
  අතිරේක ලේකම්
  (වාණිජ)
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
- ඒ. පාලිත ද සිල්වා මහතා
- නීතීඥ සුගත් හඳුන්ගේ මහතා
  උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
- චාන්දනී අමරතුංග මහත්මිය
  කම්කරු කොමසාරිස්
  කම්කරු දෙපාර්තමේන්තුව
- ආචාර්ය ඒ.යූ.සී. අතුකෝරල
  මහතා සභාපති
  ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය
- ඒ.ඩී. රංජිත් මහතා
- එච්.එම්. සිරිවිමල් හේරත් මහතා
- නිලාන් වික්‍රමසිංහ මහතා

2017 වර්ශයේ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව 10 ක් වන අතර විගණන කළමණාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව 02 කි.

2017.08.30 දින සිට පත්වූ අධ්‍යක්ෂ මණ්ඩලය

- ආචාර්ය (ඉංජිනේරු) ලයනල් පින්ටු මහතා
  මහතා සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- ඩී.එච්.එස්. පුල්ලේපෙරුම මහත්මිය
  අධ්‍යක්ෂ
  මුදල් අමාත්‍යාංශය

- ඒ.ඒ්ච්.එම්.යූ. අරුණා බණ්ඩාර
  මහතා අධ්‍යක්ෂ
  කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

- නිතීඥ සමන් සේනාධීර

- සුරේෂ් ද මෙල් මහතා

- නිතීඥ නිලක්
  කාරියවසම් උප සභාපති
  ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

- ආර්.පී.ඒ. විමලවීර මහතා
  කම්කරු කොමසාරිස් ජනරාල්
  කම්කරු දෙපාර්තමේන්තුව

- ශෙහාන් සෙනෙවිරත්න මහතා
  සභාපති
  ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

- ආචාර්ය (ඉංජිනේරු) ලලිත් ලියනගේ

- නිතීඥ ලක්ෂ්මන් සරත් වීරක්කොඩි

පාලක මණ්ඩල වාර්තාව

1995 අංක 12 දරණ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි පනත යටතේ 1995 අගෝස්තු මස 16 වන දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවනු ලැබිය.

2017 වර්ෂයේ දී ජාතික වෘත්තීය පුහුණු ආයතන 07 ක් දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22 ක් හා ප්‍රාදේශියව ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 198 හා ලියාපදිංචි වූ බන්ධනාගාර හා පුනරුත්තාපන මධ්‍යාස්ථාන 06 කින් සමන්විත වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ජාලයක් ක්‍රියාත්මක කරමින් වෘත්තීය පුහුණු වැඩසටහන් 2094 ක් පූර්ණ කාලීනව හා අර්ධ කාලීනව පවත්වා යෞවන යෞවනියන් 36695 කට තම සේවය සැපයීමට සමත් වූ මෙම ආයතනය මෙම වසරේ දී සිය 21 වන සංවත්සරය සමරනු ලැබීය.

2017 වසරේ ජයග්‍රහණයන්

★ 2012-2015 කාල පරාසයන්ට අදාල ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 ට (NVQ L5) අයත් වන තොරතුරු හා සන්නිවේදන, ප්‍රමාණ සමීක්ෂණ හා විලේපන වේදය පාඨමාලා හැදෑරූ ආධුනිකයන් 475 දෙනෙකු සඳහා 2017 ඔක්තොම්බර් 19 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදි ප්‍රථම ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම.

★ දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන 227 ක දී පාසල් අධ්‍යාපනය නිම කළ තරුණ තරුණියන් 32,805 කට පූර්ණ කාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම. මෙය 2016 වසර හා සැසඳීමේ දී 16% ක වර්ධනයකි.

★ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයන් හි නියැලෙන්නන්ගේ වෘත්තීය සංවර්ධනයට හා අභිමත වෘත්තීන්ට පිවිසීමට බලාපොරොත්තු වන ආධුනිකයන් 3,890 දෙනෙකු සඳහා අර්ධ කාලීන පුහුණුව ලබාදීම.

★ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 21,184 කුත් ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) සහතික 1,560 කුත් පෙර දැනුම ඇගයීම (RPL) යටතේ සහතික 2,067 කුත් වශයෙන් සහතික 24,811 ක් නිකුත් කිරීම. මෙය මෙම වසරේදි නිකුත් කිරීමට ඉලක්ක කරනු ලැබූ 15,700 ක් වන සම්මත සංඛ්‍යාවෙන් 47% වර්ධනයකි.

★ පුහුණුව සාර්ථකව අවසන් කල ආධුනිකයන් දේශීය රැකියා අවස්ථා 5,378 ටත් විදේශීය රැකියා අවස්ථා 146 ටත් යොමු කිරීම හා 1,137 ක් ස්වයං රැකියා සඳහා යොමු වීමත් මඟින් 6,661 දෙනෙකු ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම.

★ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 24 ක් පවත්වා 486 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව ලබාදීම හා ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය (SEPI) යෝජනා ක්‍රමය යටතේ නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පුහුණුලාභීන් 179 ක් සඳහා රුපියල් මිලියන 85.45 ක් රාජ්‍ය බැංකු තුලින් ණය පහසුකම් වශයෙන් ලබාදීම.

★ පුහුණුව ලබන ආධුනිකයන්ගේ දැනුම කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා 62 ක් සංවිධානය කිරීම.

★ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සම්බන්ධතා ගොඩනැගීමේ වැඩසටහන යටතේ (PPP) කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 44 ක් පවත්වා වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන් 3,175 දෙනෙකුගේ නවීන තාක්ෂණික දැනුම හා කුසලතා යාවත්කාලීන කිරීම.

★ ත්‍රිකුණාමලයේ පැවති යොවුන්පුර 2017 ජාතික වැඩසටහන යටතේ RPL ඇගයීම් ක්‍රමවේදය මඟින් NVQ මට්ටම් 03 ට අදාළව සහතිකපත් 143 ක් නිකුත් කිරීම.

★ ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (SSDP) යටතේ RPL ඇගයීම් ක්‍රමවේදය මඟින් NVQ මට්ටම් 03 ට අදාළව ඇගයීම් 135 ක් සඳහා අවසන් ඇගයීම් සිදුකිරීම.

★ කාර්යය මණ්ඩලයේ දැනුම කුසලතාවය හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් අධ්‍යයන කාර්යය මණ්ඩලයේ 279 දෙනෙකුත් අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ 329 දෙනෙකුත් විවිධ පුහුණු වැඩසටහන් මඟින් පුහුණු කිරීම හා 41 දෙනෙකු සඳහා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා යොමුකිරීම.

★ වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් 3,664 ක් පැවැත්වීම මගින් 176,943 දෙනෙකු වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීම.

■ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සන්නාමය ප්‍රවර්ධනය හා ආධුනිකයන් බඳවා ගැනීම ඉලක්ක කර ගනිමින් විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස ශ්‍රී ලංකාව පුරා විහිදුනු තෝරාගත් දුම්රිය ස්ථාන 47 ක සන්නාමකරණ බිල්බෝඩ් සවි කිරීම හා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් බස්රථ 12 ක් හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ 07 ක් GTZ ආයතනයේ අනුග්‍රහයෙන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් සන්නාමකරණය කිරීම.

★ දිස්ත්‍රික් අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩි ඉල්ලුමක් පවතින පාඨමාලා හඳුනාගැනීමේ පර්යේෂණය හා නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර දීර්ඝ කාලීනව සාර්ථකව පවත්වාගෙන යාම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන 04 ක් සිදු කිරීම.

★ ගුණාත්මක වෘත්තීය පුහුණු ලබා දීමේ අරමුණින් පුහුණු මධ්‍යස්ථාන 47 ක තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම.

★ ළමා සුරැකුම් විෂයමාලාව සකස් කිරීම හා පුහුණු පාඨමාලා ආරම්භ කිරීම.

★ භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අයවැය යෝජනා යටතේ රුපියල් මිලියන 56.23 ක් වැයකර වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීම.

★ ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ (SSDP) රුපියල් මිලියන 198.37 ක් වැය කර වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 15 ක් සංවර්ධනය කිරීම.

■ මෝස්තර නිර්මාණ ශිල්පී පාඨමාලාව සංවර්ධනය කිරීම සඳහා ඒචීරුක ඔජ්යබදකදටසැි ආයතනය සමග ගිවිසුම්ගතව බැමජඑරී හිඑැප මෘදුකාංග භාවිතයෙන් මෝස්තර නිර්මාණ ශිල්පී පාඨමාලා පුහුණු කටයුතු ආරම්භ කිරීම.

■ කොරියානු සංවර්ධන බැංකුවේ ආධාර මත හඬු බැඩැක 5 පාඨමාලා පැවැත්වීම සඳහා ඔරුගොඩවත්ත පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

★ මෝස්තර නිර්මාණ ශිල්පී පාඨමාලාව (NVQ Level 5-6) ආරම්භ කිරීම.

★ ඉංග්‍රීසි විෂය වෘත්තීය පුහුණු පාඨමාලා වලට ඇතුළත් කිරීම හා NVQ Level 1, 2 අර්ධ කාලීන පාඨමාලා පැවැත්වීම.

★ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ ක්‍රියාත්මක පාඨමාලා 42 ක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබාගැනීම. මේ වනවිට ප්‍රතීතනය කර ක්‍රියාත්මක කරන පාඨමාලා සංඛ්‍යාව 1,021 කි.

■ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමග ගිවිසුම්ගතව එහි සේවකයින් 5,000 ක් සඳහා දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන මගින් ව්‍යාපාර සැලසුම්කරණය හා පරිගණක දැනුම පිළිබඳව අර්ධ කාලීන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

★ 2017 අයවැය යෝජනා යටතේ ලබාදුන් රුපියල් මිලියන 146.16 ක් වැයකර නොමිලේ වෘත්තීය පුහුණුව ලබාදීම හා පුහුණු ලාභින්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීම.

★ රාජ්‍ය - පෞද්ගලික සම්බන්ධතා ගොඩනැංවීමේ අරමුණින්;

■ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා ඉල්ලුමක් ඇති කිරීමේ ආරම්භක පියවරක් ලෙස SIAM CITY CEMENT (LANKA) LIMITED ආයතනය හා එක්ව පුත්තලම දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් පාඨමාලා සංවර්ධනය හා ආධුනිකයින් සඳහා රු. 4,000-10,000 දක්වා දිරි දීමනාවක් ගෙවීමට කටයුතු කිරීම.

■ Associated Motor Ways (Pvt) Ltd ආයතනය සමග ගිවිසුම්ගතව බුස්ස වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය හා එහි මොටර් කාර්මික ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා ආරම්භ කිරීම.

■ දොන් බොස්කෝ (Don Bosco) ආයතනය සමග ගිවිසුම්ගතව පාඨමාලා පැවැත්වීම.

■ Micrsoft ආයතනයේ ශ්‍රී ලංකා නියෝජිත Sanje Privet Limited ආයතනය හා එක්ව Microsoft Academy 03 ක් පිහිටුවීම.

■ අයිඩියල් මෝටර්ස් පුද්ගලික ආයතනය (IDEAL Motors Privet Limited) හා එක්ව ග්‍රාමීය ප්‍රදේශවල තෝරාගත් රැකියා විරහිත තරුණ තරුණයින් 40 කගේ ජීවන තත්ත්වය නංවාලීමේ අරමුණින් මෝටර් රථ කාර්මික ශිල්පී පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

■ ORACEL Academy Sri Lanka ආයතනය සමග ගිවිසුම්ගත වී වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 35 ක ආධුනිකයන් 10,000 ක් හා උපදේශකවරු 150 ක් පුහුණු කිරීම.

■ නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ආයතනය (Natures Beauty Creation) දිවයින පුරා ක්‍රියාත්මක වන රූපලාවන්‍ය පාඨමාලා සඳහා රුපියල් මිලියන 02 ක් පමණ වටිනා පුහුණු ද්‍රව්‍ය ලබාදීම.

■ සැපයුම්දාම කළමනාකරණයට අදාළ පාඨමාලා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් Colombo Institute of Logistic Management ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

■ වික්‍රමාරච්චි ශ්‍රව්‍ය හා දෘශ්‍ය ආයතනය සමග ගිවිසුම්ගතවී ඔප්ටිසියන් (Optician) පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම.

■ Jetwing ආයතනය සමග ගිවිසුම්ගතව පොතුවිල් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ හෝටල් හා සංචාරක ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා පැවැත්වීම.

■ වතු ආශ්‍රිත තරුණ තරුණියන්ගේ ජීවන තත්ත්වය නංවාලීමේ අරමුණින් Premium Exports Ceylon Limited ආයතනය සමග ගිවිසුම්ගතව නුවරඑළිය ආගරපතන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කිරීම.

■ කයිතඩි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හරහා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෘත්තීය අධ්‍යාපනය ලබන නියුෆිල්ඩ් වෘත්තීය පාසල (Nuffield School for the deaf and blind in kaithody) සඳහා වෘත්තීය පුහුණු පහසුකම් සැලසීම.

■ විදුලිබල මණ්ඩලයේ සේවකයන් සඳහා විශේෂ විදුලි ශිල්පී (NVQ Level 4) පාඨමාලාවක් ආරම්භ කිරීම.

★ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා වන ඉදිකිරීම්, ජලනල හා වඩුකාර්මික පාඨමාලා සඳහා ආධුනිකයන් එකසිය විසි දෙනෙකු නිපුණ ශිල්පීන් බවට පත්කර ඔවුන්ට අභිමානයක් ඇතිවන පරිදි රැකියාගත කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් බස්නාහිර පළාතේ පුහුණු මධ්‍යස්ථාන 05 ක ආරම්භ කිරීමට විශේෂ කාර්ය බලකායක් පිහිටුවීම.

2018 වසර සඳහා වැඩසටහන් හා ඉලක්ක

★ ශ්‍රම වෙළඳපොල ප්‍රමුඛ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා නිපුණ ශිල්පීන් බිහිකිරීමේ නියමු වැඩසටහනක් ලෙස දින 120 කින් අධුනිකයන් 120 දෙනෙකු පේදරේරු, ජලනල හා වඩුකාර්මික ක්ෂේත්‍ර සඳහා පුහුණු කිරීම.

★ දිවයින පුරා තරුණ තරුණියන් 31,560 කට පූර්ණ කාලීන වෘත්තීය පුහුණුව ලබාදීම.

★ රැකියාවන්හි නිරතවූවන් සහ රැකියා අපේක්ෂිතයන් 4,475 කට අර්ධ කාලීනව වෘත්තීය පුහුණුව ලබාදීම.

★ පාඨමාලා 98 ක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබා ගැනීම.

★ පුහුණු මධ්‍යස්ථාන 60 ක තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කිරීම.

★ පුහුණු මධ්‍යස්ථාන 50 ක තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධතිය (QIS) ස්ථාපිත කිරීම.

★ විලේපන වේදය (Cosmetology) පාඨමාලාව (NVQ Level - 06) මට්ටමට ප්‍රතීතනය කර ආරම්භ කිරීම.

★ මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රයේ අත්‍යවශ්‍ය පාඨමාලාවක් වන වීල් එලයින්මන්ට් ශිල්පී පාඨමාලාව තලල්ල හා නියාගම පුහුණු මධ්‍යස්ථානවල ආරම්භ කිරීම.

★ චීන රජයේ ආධාර මත (E-Commerce) පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.

★ තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන 13 ක් ව්‍යාපාර සැලසුම් ඒකකයන් ලෙස සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

★ වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳව දිවයිනපුරා පාසල් සිසුන්, පාසල් හැරගිය තරුණ තරුණියන්, වෘත්තීය පුහුණුලාභීන්ගේ දෙමව්පියන් ගුරුවරුන් හා වෙනත් සමාජ සංවිධාන සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 3,952 මගින් 138,320 දෙනෙකු දැනුවත් කිරීම.

★ සාර්ථකව පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් ව්‍යාපාර ආරම්භ කිරීමට දිරිගැන්වීමක් ලෙස ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 21ක් පවැත්වීම හා SEPI ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්නා ව්‍යාපාර සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සලසා දීම.

★ පුහුණුව අවසන් කරන ආධුනිකයන් 7,600 ක් දේශීය රැකියා සඳහාත් 500 ක් විදේශීය රැකියා සඳහාත් යොමු කිරීම හා 1,000 ක් ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පෙළඹවීම.

★ පුහුණුව අවසන් කරන ආධුනිකයන් රැකියාගත කිරීම හා වැඩිදුර පුහුණු අවස්ථා ලබාදීම අරමුණු කරගෙන රැකියා වෙළඳපොළ 08 ක් පැවැත්වීම.

★ පුහුණුව ලබන ආධුනිකයන්ගේ දැනුම කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් කර්මාන්තශාලා නිරීක්ෂණ චාරිකා 60 ක් සංවිධානය කිරීම.

★ වෘත්තීය පුහුණුව ලැබූ පුහුණුලාභීන්ට ක්ෂේත්‍රය තුළ දැනුම හා තාක්ෂණික කුසලතා යාවත්කාලීන කිරීමේ අරමුණු ඇතිව කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් 40 ක් නිපුණ ශිල්පීන් 1,600 කට පැවැත්වීම.

ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්ටු
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඉහළ හා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කාර්යය මණ්ඩලය

සභාපති

1. ඉංජිනේරු (ආචාර්ය) ලයනල් පින්ටු (2017.06.07 දින සිට)
2. මේජර් ජනරාල් ගාමිණි හෙට්ටිආරච්චි (විශ්‍රාමික) (2017.06.06 දින දක්වා)

උප සභාපති

1. නීතිඥ තිලක් කාරියවසම් (2017.06.07 දින සිට)
2. නීතිඥ සුගත් හඳුන්ගේ (2017.06.06 දින දක්වා)

අධ්‍යක්ෂ ජෙනරාල්

එච්. චූලාංගනී පෙරේරා මිය

අධ්‍යක්ෂවරු

1. ඩබ්.ඒ. රණවීර මහතා
2. ආචාර්ය සිද්ධිකා පී. සේනාරත්න මිය
3. එච්.යූ. කාරියවසම් මහතා (වැ.බ)
4. යූ.කේ. නන්ද මහතා (වැ.බ) 2017.02.02 දින සිට
5. එස්.එම්. එදිරිසිංහ මිය (වැ.බ) 2017.06.13 දින සිට
6. කේ.පේ. කෝරළගේ මහතා (2017.01.22 දින සිට විශ්‍රාම ගොස් ඇත.)
7. සමන් කුලසූරිය මහතා (2017.07.04 දින සිට අගාමාත්‍ය කාර්යාලයට වසරක කාලයක් සඳහා නිදහස් කර ඇත)

ප්‍රධාන අභ්‍යන්තර විගණක

පී.එම්. විජේසිංහ මහතා (රාජකාරී ඉටු කිරීම)

නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

1. එන්.ඩී.පී. ධම්මික මහතා
2. එන්.එස්.ඩී. නවරත්න මහතා
3. ඒ.කේ. ආරච්චිගේ මහතා
4. ඊ.ඒ.ඩී.එස් සේනාරත්න මහතා
5. පී.වී.පී.එන්. පෙරේරා මහතා
6. ආර්.එන්.කේ.එම්.පේ. සෙනෙවිරත්න මහතා
7. එන්.කේ. ඉලේසිංහ මහතා
8. එච්.ටී.එස්. වික්‍රමරත්න මහතා
9. එච්.ඩබ්. රොහාන් ප්‍රියන්ත මහතා
10. එම්.එම්.එන්.බී. මධුරසිංහ මහතා
11. ඩී.ආර්.එස්.එල්. දසනායක මහතා
12. ඩබ්.පී. විජේරත්න මහතා
13. එච්.පී. මනම්පේරි මහතා
14. ඒ.එම්.ටී.එස්. ආටිගල මහතා
15. ටී. විනෝදරාජා මහතා
16. ඒ.එම්.ඒ. ජයතිස්ස මහතා (2017.08.16 දින විශ්‍රාම ගොස් ඇත.)
17. පී.ඩී. ජයසිංහ මහතා
18. වී. කනගසුන්දරම් මහතා
19. එච්.ඒ.පී. ගුණවර්ධන මහතා

සහකාර අධ්‍යක්ෂවරු

1. ඒ.ඒ. ජබීර් මහතා
2. පී.ආර්.එම්.සී. කුලතුංග මිය (2017.04.09 දින විශ්‍රාම ගොස් ඇත.)
3. පී.බී.පී.අයි.බී. වැගන්තලේ මහතා
4. රාධාකෘෂ්ණන් මධුරතන් මහතා
5. කේ. නිරංජන් මහතා
6. ඒ.ඒ.ඩබ්.පී.ආර්.ආර්. බණ්ඩාර මහතා
7. වී.පී. නිමල්සිරි මහතා
8. පී.එන්. අබේසිංහ මහතා
9. පී.එල්.ඒ. පීරිස් මහතා
10. ඩී.ඒ.එස්. අතුකෝරල මහතා
11. ආර්.එම්.ආර්. රත්නායක මහතා
12. බී.එච්.ඒ. නෙල්සන් මහතා
13. එස්. මැද්දේගොඩ මහතා
14. සී.පේ. විද්‍යානපතිරණ මහතා
15. එම්.පී.පී. සමන් මහතා
16. කේ.ඩී.එන්. ද සිල්වා මහතා
17. ඩී.ඒ. ජයරත්න මහතා
18. ආර්. සුනිල් මහතා
19. පී.එච්.පී. දමයන්ති මිය
20. එන්.එම්.වී.කේ. හේරත් මිය
21. පී.පේ. ජයවර්ධන මිය
22. එම්.කේ.බී. ජයතිලක මහතා
23. එම්.බී. නලීම් මහතා
24. ආර්. පතිරගේ මිය
25. පී.පී. ප්‍රසන්න මහතා
26. එච්. එදිරිසිංහ මිය
27. ඒ.ඒ.ඩී.ටී. ශාන්ත මහතා
28. ටී.වී.ඩබ්. දේවප්‍රිය මහතා
29. යූ.පී.පේ. ප්‍රියදර්ශන මහතා
30. ආර්.ඩී. ප්‍රදීපිකා මිය
31. පේ. ඉනෝකා යූ.පී. ගුණවර්ධන මෙනෙවිය
32. ඊ.පේ. විජේතුංග මහතා
33. ඩබ්.එම්.ඒ.එස්.එල්. විජේනායක මිය
34. එච්.එල්. සිසිර මහතා
35. ඩබ්.කේ. සුමිත් වසන්ත මහතා
36. ආර්. අහිලන් මහතා
37. එච්.ටී.ඩී.ආර්.එස්. විජේසිංහ මහතා
38. නිලිණා රණසිංහ මහතා
39. පී.ඩී. ශ්‍යාමලී මිය
40. සී.ඩී. සමරනායක මහතා
41. සී.යූ.එම්. කොඩිතුවක්කු මිය
42. සුනිල් අබේසිංහ මහතා
43. පී.කේ.ඩී.සී. කුමාර මහතා
44. එස්.එම්.පේ. සුවේන්ද්‍ර මහතා
45. එස්.එම්.එම්.කේ. සියමුදලි මිය
46. එන්.කේ. අඹගහවත්ත මිය
47. ඩී.සී.ඕ. විනාන මිය
48. ඒ.ඩී.එස්. සමරසිංහ මහතා
49. ඒ.පී. ජගත් නිශාන්ත මහතා
50. එල්.පී.කේ.ඩබ්ලිව්. වැලිවත්ත මහතා
51. ඩී.එම්.පී.එස්. අතුකෝරළ මහතා
52. ඩී.එම්. යහම්පත් මහතා
53. කේ.පී.ඩී.පී. සිරිසේන මහතා
54. එන්.ඒ.ඒ.ඩී. නාගහවත්ත මහතා
55. නීති නිලධාරි/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - ඩබ්.පී.ඊ.එම් පීනදාස මෙනවිය
56. අභ්‍යන්තර විගණක - ආර්.පී. හෙට්ටිආරච්චි මහතා

කාර්යය මණ්ඩල සංයුතිය

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2017.12.31 දිනට ඒ ඒ තනතුරු මට්ටමින් 2008 දෙනෙකු සේවයේ යෙදී සිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2017 වර්ෂය සඳහා අනුමත කාර්යය මණ්ඩලය 2582 කි.

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය	සේවා කාණ්ඩය
01	අධ්‍යක්ෂ ජනරාල්	1	1	0	HM 2-1
02	අධ්‍යක්ෂ	6	3	3 Actg	HM1-1
03	ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	1	0	
04	නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ	86	73	13	MM 1-1
05	නීති නිළධාරී	1	1	0	
06	අභ්‍යන්තර විගණක	1	1	0	
07	ඉංජිනේරු	1	0	1	
08	පරිපාලන නිළධාරී	2	2	0	JM 1-1
09	පරීක්ෂණ හා ඇගයීම් නිළධාරී	12	11	1	
10	විමර්ශන නිළධාරී	1	1	0	
11	ප්‍රවාහන නිළධාරී	1	0	1 Actg	
12	සැපයුම් නිළධාරී	1	1	0	
13	මුද්‍රණ නිළධාරී	1	1	0	
14	අභ්‍යන්තර විගණන නිළධාරී	3	3	0	
15	පද්ධති විශ්ලේෂක	1	0	1	
16	සුභසාධක නිළධාරී	1	1	0	
17	ගිණුම් නිළධාරී	33	33	0	
18	ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිළධාරී	10	10	0	
19	පුහුණු නිළධාරී	88	48	40	
20	පර්යේෂණ නිළධාරී	2	2	0	
21	සැළසුම් නිළධාරී	2	2	0	
22	සභාපති සඳහා වූ පෞද්ගලික සහකාර	1	0	1	
23	පෞද්ගලික සහකාර*	7	5	0	
24	භාෂා පරිවර්තක(සිංහල/ඉංග්‍රීසි)	1	0	1	MA 5-2
25	භාෂා පරිවර්තක(සිංහල/දෙමල)	3	0	3	
26	ජ්‍යෙෂ්ඨ උපදේශක	176	14	162	MA 4
27	වැඩසටහන් නිළධාරී	69	69	0	
28	විගණන සහකාර*	3	1	0	
29	ව්‍යාපෘති සහකාර*	34	9	0	MA 3
30	තාක්ෂණික සහකාර	3	1	2	346 (contract)MA 2-2
31	උපදේශක	1514	1235	279	
32	ක්‍රීඩා උපදේශක	31	0	31	
33	සැලසුම් ශිල්පී	1	0	1	

34	ප්‍රමාණ සමීක්ෂක	2	0	2	
35	කාර්මික නිලධාරී(සිවිල්)	5	0	5	
36	කළමණාකරණ සහකාර	191	191	0	2 (contract) MA 1-2
37	සහකාර උපදේශක (LRUC)*	38	33	0	
38	ඇමුණුම්කරු (මුද්‍රණ)	3	1	2	
39	නිවාඩු නිකේතන භාරකරු	2	1	1	
40	සුපරීක්ෂක (මුද්‍රණ)	1	0	1	
41	සුපරීක්ෂක (ගොඩනැගිලි)	1	0	1	
42	රියදුරු	64	64	0	PL 3
43	ගබඩාකරු*	2	2	0	PL 2
44	මුද්‍රණ සහයක	3	2	1	
45	බැඳුම්කරු (මුද්‍රණ)	2	1	1	
46	යන්ත්‍ර ක්‍රියාකරු (මුද්‍රණ)	2	2	0	
47	කාර්යාල සහයක	8	5	3	PL 1 (*1 contract)
48	මුරකරු*	65	48	0	
49	කම්කරු	95	95	0	
	එකතුව	2582	1974	523	

* දැනට සිටින පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුර අනුමත කර ඇත. ඉන්පසු අහෝසි වේ.

කාර්යය මණ්ඩල සංයුතිය (සේවා කාණ්ඩය අනුව)

	තනතුර	අනුමත කාර්යය මණ්ඩලය	වසර අවසානය වන විට කාර්යය මණ්ඩලය	වර්ෂය අවසානයේ පුරප්පාඩු / අතිරික්තය
01	HM 2- ජ්‍යෙෂ්ඨ කළමනාකාර HM 1-1 ජ්‍යෙෂ්ඨ කළමනාකාර	08	05	03
02	MM 1-1 කළමනාකාර	89	75	14
03	JM 1-1 කණිෂ්ඨ කළමනාකාර	166	120	44
04	MA 5-2 බලාත්මක කිරීමේ / ක්‍රියාත්මක කිරීමේ / ව්‍යාප්ති නිලධාරීන්	04	0	04
05	MA 4 ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවා	248	84	162 (*1 Personal)
06	MA 3 ආශ්‍රිත නිලධාරීන්	34	09	0 (*9 Personal)
07	MA 2-2 කළමනාකාර සහකාර-තාක්ෂණ	1556	1236	320
08	MA 1-2 කළමනාකාර සහකාර* තාක්ෂණ නොවන	236	226	5 (*33 Personal)
09	PL 3 ප්‍රාථමික ශිල්පී	64	64	
10	PL 2 ප්‍රාථමික අර්ධ ශිල්පී	09	07	02 (*02 Personal)
11	PL 1 ප්‍රාථමික ශිල්පී නොවන	168	148	03 (*03 Personal)
	එකතුව	2582	1974	557

* දැනට සිටින පුද්ගලයින්ට පෞද්ගලික වන සේ එම තනතුර අනුමත කර ඇත. ඉන්පසු අහෝසි වේ.

සේවා ගණය



කාර්යය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම.

2017 වර්ෂයේ දී පහත වර්ගීකරණයක් යටතේ කාර්යය මණ්ඩලය අදාල වැඩසටහන් සඳහා සහභාගී කරවීමට හැකිවිය.

අධ්‍යයන	279
අනධ්‍යයන	329
විදේශීය	50









වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම

2017 වර්ෂයේ පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා 127 කට ඇතුලත් වන පුහුණු වැඩසටහන් 2,094 ක් දිවයින පුරා ක්‍රියාත්මක කර ආයතනික පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 36,695 කි. මෙම සංඛ්‍යාව 2016 වර්ෂයට සාපේක්ෂව 16 % ක වර්ධනයකි. ඊට අමතරව කුසලතා සංවර්ධන වැඩසටහන් හා ව්‍යවසායකත්ව සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් පුහුණුව ලද සංඛ්‍යාව 5,927 කි. ඒ අනුව 2017 වර්ෂයේ පුහුණුව ලැබූ සමස්ත ආධුනිකයන් සංඛ්‍යාව 42,622 කි.

වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වීම / පුහුණුව අවසන් කිරීම

වර්ෂය	2015	2016	2017
පුහුණුවට ඇතුලත් වූ සංඛ්‍යාව	32,556	35,013	42,622
පුහුණුව අවසන් කල සංඛ්‍යාව	27,952	29,364	35,983

*පුහුණුව සඳහා ඇතුලත් වූ ආධුනිකයින් සංඛ්‍යාව 3,521 දෙනෙකු 2017 වසරේදී පුහුණුව අවසන්කිරීමට නියමිතය.



පුහුණු ක්ෂේත්‍ර සඳහා ආධුනික ඉල්ලුම -2017

	ක්ෂේත්‍රය	ඇතුලත් වූ ආධුනික සංඛ්‍යාව(ආයතනික පුහුණුව)	ප්‍රතිශතය
1	කෘෂිකර්ම, වැවිලි හා පශු සම්පත්	53	0.14
2	මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව	3527	9.61
3	ගොඩනැගිලි හා ඉදිකිරීම්	3692	10.06
4	විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ	3695	10.07
5	ධීවර හා මත්ස්‍ය වගාව	48	0.13
6	ආහාර තාක්ෂණය	749	2.04
7	මැණික් හා ස්වර්ණාභරණ	138	0.38
8	හෝටල් හා සංචාරක	1955	5.33
9	තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	9360	25.51
10	සම් ආශ්‍රිත නිෂ්පාදන	58	0.16
11	ලෝහ හා ලුහු ඉංජිනේරු	1470	4.01
12	කාර්යාල කළමණාකරණය	152	0.41
13	දැව ආශ්‍රිත	1309	3.57
14	පුද්ගල හා සමාජ	5436	14.81
15	මුද්‍රණ හා ඇසුරුම්	80	0.22
16	ශීතකරණ හා වායුසමීකරණ	658	1.79
17	රෙදිපිළි හා ඇඟලුම්	4276	11.65
18	සෞඛ්‍ය හා සමාජ කටයුතු	20	0.05
19	වෙනත්	19	0.05
	එකතුව	36695	

පුහුණුවට බඳවා ගැනීම - 2017



රැකියා අවස්ථා බහුල ශ්‍රම වෙළඳපොල ඉල්ලුම සහිත පාඨමාලා සඳහා ඇතුලත්වන ආධුනික සංඛ්‍යාව සමස්ථ ඇතුලත් වීමෙන් 40% කි.

ක්ෂේත්‍රය	පිරිමි	ගැහැණු	එකතුව	ප්‍රතිශතය
මෝටර් රථ අලුත්වැඩියා හා නඩත්තුව	3,384	143	3,527	9.61
ගොඩනැගිලි හා ඉදිකිරීම්	3,098	594	3,692	10.06
විදුලි, විද්‍යුත් සහ විදුලි සංදේශ	3,614	81	3,695	10.07
හෝටල් හා සංචාරක	1,771	184	1,955	5.33
දැව ආශ්‍රිත	1,256	53	1,309	3.57
ශීතකරණ හා වායුසමීකරණ	652	6	658	1.79
එකතුව	13,775	1,061	14,836	40.43





පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය

2017 වර්ෂයේ දිවයින පුරා ක්‍රියාත්මක වූ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත පරිදි වේ. එයට අමතරව බන්ධනාගාර 16 කත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 02 කත් වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්විය.

වර්ෂය	2015	2016	2017
ජාතික වෘත්තීය පුහුණු ආයතන	07	07	07
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	22	22	22
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	194	203	198
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අනෙකුත් මධ්‍යස්ථාන (බන්ධනාගාර හා පුනරුත්ථාපන)	-	-	06
එකතුව	223	232	233



වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ව්‍යාප්තිය 2017

පළාත	දිස්ත්‍රික්කය	ආයතන සංඛ්‍යාව						Total
		NVTI	DVTC	VTC	AT	PC	Reh	
බස්නාහිර	ගම්පහ	-	1	15	3	[1]	-	17
	කොළඹ	2	1	12	2	[1]	-	16
	කළුතර	-	1	8	1	1	-	09
වයඹ	පුත්තලම	-	1	6	-	-	-	07
	කුරුණෑගල	-	1	7	-	-	-	08
උතුර	යාපනය	-	1	5	1	-	-	06
	කිලිනොච්චිය	-	1	4	1	-	-	05
	මුලතිව්	-	1	2	1	-	-	03
	මන්නාරම	-	-	1	-	-	-	01
	වව්නියාව	-	1	4	1	-	[1]	06
නැගෙනහිර	ත්‍රිකුණාමලය	-	1	8	-	-	-	09
	මඩකලපුව	1	-	13	-	1	-	14
	අම්පාර	-	1	13	1	-	-	14
දකුණ	ගාල්ල	2	1	12	4	2	-	15
	මාතර	1	-	12	-	-	-	13
	හම්බන්තොට	1	1	9	-	1	-	12
සබරගමුව	කෑගල්ල	-	1	8	-	1	-	09
	රත්නපුරය	-	1	11	-	2	-	12
ඌව	බදුල්ල	-	1	8	-	[1]	-	09
	මොණරාගල	-	1	7	-	1	-	08
මධ්‍යම	මහනුවර	-	1	10	-	2	-	11
	මාතලේ	-	1	5	1	-	-	06
	නුවරඑළිය	-	1	4	-	-	-	05
උතුරු මැද	අනුරාධපුර	-	1	10	-	1	-	11
	පොලොන්නරුව	-	1	4	1	[1]	[1]	7
	එකතුව	7	22	198	17	16	2	233

NVTI - ජාතික වෘත්තීය පුහුණු ආයතන
DVTC - දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
VTC - වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
AT - අනුබද්ධිත
PC - බන්ධනාගාර
Reh - පුනරුත්ථාපන මධ්‍යස්ථාන
[ ] - පුහුණු මධ්‍යස්ථාන ලෙස ඔඩිඇ ලියාපදිංචිව ඇති මධ්‍යස්ථාන


NVTI - ජාතික වෘත්තීය පුහුණු ආයතන
DVTC - දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
VTC - වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
AT - අනුබද්ධිත
PC - බන්ධනාගාර
Reh - පුනරුත්ථාපන මධ්‍යස්ථාන
Jaffna
Kilinochchi
Mullaitivu
Vavuniya
Mannar
Anuradhapura
Trincomalee
Puttalam
Polonnaruwa
Batticaloa
Kurunegala
Matale
Kandy
Ampara
Gampaha
Kegalle
Nuwara Eliya
Badulla
Colombo
Monaragala
Kaluthara
Ratnapura
Hambantota
Galle
Matara

වෘත්තීය පුහුණු පරීක්ෂණ හා ඇගයීම්

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පුහුණුවලත් ආධුනිකයින් ඇගයීම් ක්‍රමවේදයන් මගින් ඇගයීම් කර සහතිකපත් ලාභීන් බවට පත්කරනු ලැබේ. මේ සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 5 කට අධික මුදලක් වැයකරනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂයේදී ඇගයීම් සිදුකර නිකුත් කල සහතිකපත් ප්‍රමාණය පහත පරිදි වේ.

අංක	වර්ගය	ඇගයීමික සංඛ්‍යාව		
		ඉලක්කය	ප්‍රගතිය	%
01	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	15500	21184	136
02	ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ)	1000	1560	156
03	පෙරදැනුම ඇගයීම් ක්‍රමය (RPL)	1000	2067	206
එකතුව		17500	24811	141

මෙම වසරේ නිකුත් කරන ලද සමස්ථ සහතිකපත් සංඛ්‍යාව 2016 වසර හා සැසඳීමේදී 27% ක වර්ධනයක් වන අතර වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අනෙකුත් ආයතන හා සැසඳීමේදී ද ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කළ ආයතනයන් අතුරින් ප්‍රමුඛස්ථානයද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට හිමිවේ.

ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකපත් නිකුත් කිරීම් - 2016

	ආයතනය	පිරිමි	ගැහැණු	එකතුව
01	කාර්මික අධ්‍යාපනහාපුහුණුකිරීමේ දෙපාර්තුමේන්තුව (DTET)	2306	1116	3425
02	ජාතිකආධුනිකත්වහා කාර්මික පුහුණුකිරීමේඅධිකාරිය (NAITA)	6633	3336	9969
03	ශ්‍රී ලංකාවෘත්තීයපුහුණුඅධිකාරිය (VTA)	8986	5285	14271
04	ජාතික තරුණාසේවාසභාව (NYSC)	531	1119	1650
05	පෞද්ගලිකආයතන (Private)	5216	5199	10415
එකතුව		23675	16055	39730

මූලාශ්‍රය ශ්‍රම වෙළඳපල සගරාව (TVEC)

වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය

තරුණ තරුණියන්ගේ රුචිකත්වය හා සුදුසුකම් මත ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තෝරා ගැනීමට මඟ පෙන්වීම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ තවත් කාර්තෘවයකි. ඒ සඳහා සුදුසුකම් ලත් නිළධාරි මණ්ඩලයක් විසින් යෞවන යෞවනියන්ගේ රුචිකත්වය හා සුදුසුකම්මත ඔවුනට ගැලපෙන වෘත්තීය ක්ෂේත්‍ර තොරා ගැනීමට දීපව්‍යාප්තව වෘත්තීය මාර්ගොපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ. 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

ඉලක්කගත කණ්ඩායම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
පාසැල් සිසුන්	1159	64684
පාසැල් හැරයන්නන්	608	32883
පුහුණුවන්නන්	581	24875
දෙමාපියන්	571	24123
වෙනත්	238	14113
එකතුව	3157	160678

රැකියාගත කිරීම

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ලියාපදිංචි කරන ලද දේශීය හා විදේශීය රැකියා ආයතන මඟින් 2017 වසර සඳහා පුහුණු ලාභීන් 6661 දෙනෙකු ශ්‍රම වෙළඳපොල අවශ්‍යතා සපුරාලීමට සෘජුව හා ස්වයං රැකියා තුලින් යොමු කිරීමට රැකියා ස්ථාපන ඒකකයට හැකිවිය.

අංකය	පුහුණු ක්ෂේත්‍රය	රැකියා ගත කල සංඛ්‍යාව			
		දේශීය	විදේශීය	ස්වයං	එකතුව
01.	ගොඩනැගිලි හා ඉදිකිරීම්	540	9	89	638
02.	මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව	670	25	51	746
03.	විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ	796	22	153	971
04.	ශීතකරණ හා වායු සමීකරණ	262	16	9	287
05.	ආහාර තාක්ෂණය	160	7	11	178
06.	සන්නිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය	915	8	36	959
07.	හෝටල් හා සංචාරක	548	20	20	588
08.	ලෝහ හා ලූහු ඉංජිනේරු	267	13	24	304
09.	දැව ආශ්‍රිත	88	1	11	100
10.	මැණික් හා ස්වර්ණාභරණ	35	1	6	42
11.	මුද්‍රණ හා ඇසුරුම්	11	0	0	11
12.	රෙදිපිළි හා ඇඟලුම්	613	5	364	982
13.	පුද්ගල හා සමාජ	438	19	355	812
14.	කාර්යාල කළමනාකරණය	19	0	0	19
15.	ධීවර හා මත්ස්‍ය වගාව	10	0	0	10
16.	සම් ආශ්‍රිත නිෂ්පාදන	6	0	8	14
	එකතුව	5378	146	1137	6661


1000
900
800
700
600
500
400
300
200
100
0
දේශීය
විදේශීය
ස්වයං
ගොඩනැගිලි හා ඉදිකිරීම්
මෝටර් රථ අලුත්වැඩියාව හානඩත්තුව
විදුලිල විද්‍යුත් හා විදුලි සංදේශ
ශීතකරණ හා වායු සමීකරණ
ආහාර තාක්ෂණය
සත්තිවේදනය හා බහුමාධ්‍ය තාක්ෂණය
හෝටල් හා සංචාරක
ලෝහ හා ලුහු ඉංජිනේරු
දැව ආශ්‍රිත
මැණික් හාස්වර්ණාභරණ
මුද්‍රණ හා ඇසුරුම්
රෙදිපිළි හා ඇඟලුම්
පුද්ගල හා සමාජ
කාර්යාල කළමනාකරණය
ධීවර හා මත්ස්ය වගාව
සම් ආශ්‍රිත නිෂ්පාදන


17.07
2.19
80.74
දේශීය
විදේශීය
ස්වයං

රැකියා ස්ථාපනය තුලින් ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය

වර්ගය	ස්ථාපනය කළ සංඛ්‍යාව	ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය (රු මිලියන)
දේශීය රැකියා	5378	1921.31
විදේශීය රැකියා	146	116.19
ස්වයං රැකියා	1137	428.81
එකතුව	6661	2466.31

*(තෘතීයික හා වෘත්තීයඅධ්‍යාපන කොමිෂන් සභාවේ ශ්‍රම වෙළඳපොල සඟරාව හා රැකියාගත කළ ආයතනයන්හි දත්ත මත 2017 වර්ෂයේ රැකියාගත කරන ලද පුහුණුලාභීන් සංඛ්‍යාව වසරක කාලයක් සේවය කරනු ලැබූ බවට උපකල්පනය කර ඉපයූ ආදායම දළ වශයෙන් ඇස්තමේන්තු කර සකස් කර ඇත.)

	දේශීය	විදේශීය	ස්වයං	එකතුව
2015	4,696	169	776	5,641
2016	5,091	204	757	6,052
2017	5,378	146	1,137	6,662

(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් රැකියාගත කල තොරතුරු පමණි.)



රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා එක්ව සිදුකල වැඩසටහන්

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	අනුග්‍රාහක ආයතන
ටයිල් ඇතිරීම	10	405	ලංකා ටයිල්ස් සමාගම
රූපලාවන්‍ය	12	1784	නේචර්ස් බියුටි ක්‍රියේෂන්/ෆෝඑවර් ස්කින් නැචුරල්ස්
ඇලුමිනියම් පිරිසැකසුම්	12	473	ඇලුමෙක්ස් සමාගම/ස්විස්ටෙක් ඇලුමිනියම්
යතුරු පැදි හා ත්‍රිරෝද රථ අළුත්වැඩියාව	04	233	ඩේවිඩ් පීරිස් සමාගම
බේකරි නිෂ්පාදන	04	162	AB මයුරි සමාගම/කිල්ස් ෆුඩ්
විදුලි කාර්මික	02	118	ACL කේබල්ස්
එකතුව	44	3175	

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

තරුණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීම හා ඔවුන්ට අත හිත දීම ද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන අරමුණ වේ.

2017 වසර තුලදී ව්‍යවසායකත්ව පුහුණුවලත් ආධුනිකයින් 2752 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් මගින් පුහුණු කරන ලද අතර ඊට අමතරව පුහුණුකරුවන් 23 දෙනෙකු පුහුණු කරනු ලැබිය. ස්වයං රැකියාවක් අරම්භ කිරීමට අපේක්ෂිත 179 දෙනෙකු සඳහා රුපියල් මිලියන 85.45 ක් රාජ්‍ය බැංකු මගින් සුළු ව්‍යාපාර ණය වශයෙන් ලබා ගැනීමට පහසුකම් සැලසිම.

ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් - 2017

කාණ්ඩය	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව	අනුග්‍රහය
පුහුණුව හදාරමින් සිටින අධුනිකයින්	24	486	භාණ්ඩාගාර ප්‍රතිපාදන
	22	498	SSD ව්‍යාපෘතිය
වෘත්තීය පුහුණුවලත් ව්‍යාපාර අරම්භ කිරීමේ අවශ්‍යතාව ඇති අධුනිකයින්	57	1768	SSD ව්‍යාපෘතිය
පුහුණුකරුවන් පුහුණු කිරීම	01	23	SSD ව්‍යාපෘතිය

අභියෝග

- නොමිලේ වෘත්තීය අධ්‍යාපනය සැපයීම ආරම්භයත් සමඟ තුලින් ඇති වී ඇති ඉල්ලුම සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය හා භෞතික සම්පත් හිඟවීම.
- කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහළ ශ්‍රම ඉල්ලුමක් ඇති ශිල්පීය මට්ටමේ පාඨමාලාවන්ට තරුණ තරුණියන්ගේ වැඩි නැඹුරුතාවයක් නොමැතිවීම.
- තරුණ තරුණියන් වෘත්තීය පුහුණුව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුව සපයන රාජ්‍ය නොවන සංවිධාන හා අනෙකුත් ආයතන මඟින් සපයන පහසුකම් වැඩිවීම නිසා ඒ අයුරින්ම පහසුකම් සැපයීමට අපහසුවීම මත දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදු වීම.
- වෘත්තීය පුහුණුව සපයන පෞද්ගලික අංශයේ ආයතන හා තරඟකාරීව කටයුතු කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණුවේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීමට හා ආකල්ප සංවර්ධනයට පුළුල් ප්‍රචාරාත්මක වැඩසටහන් දියත් කිරීමට සිදුවීම.
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීම.
- දිවයින පුරා ක්‍රියාත්මක සෑම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකටම සමාන මට්ටමේ පහසුකම් සැපයීමට අපොහොසත් වීම.
- සේවා සපයන ආයතනයක් ලෙස රජය විසින් වෙන් කරන ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- පුහුණු ක්ෂේත්‍ර හා රැකියා ඉල්ලුම අතර ඇති නොගැලපීම අවම කර ගැනීම.
- පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය සංවර්ධනය සඳහා නවීන තාක්ෂණය උපයෝගි කර ගනිමින් පුහුණු කටයුතු කිරීම සඳහා දැනුම, හැකියාව, පළපුරුද්ද ඇති උපදේශකවරුන්ගේ හිඟකම හා ඔවුන්ට ඉහළ මට්ටමේ වැටුපක් ගෙවීමට ඇති අපහසුතාවය.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විගණන හා කළමණාකරණ

කමිටුව කාර්ය සාධනය 2017

2017 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇති අතර විගණන හා කළමණාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ සංයුතිය පහත පරිදි වේ.

කමිටු සාමාජිකයන්

ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී.රණතුංග මයා	කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
පාලිත ද සිල්වා මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නිලාන් වික්‍රමසිංහ මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2017-12-14 සිට

ඩී.එච්.එස්.පුල්ලපෙරුම මිය	කමිටු සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අරුණ බණ්ඩාර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නීතීඥ සමන් සේනාධීර මයා	කමිටු සාමාජික හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

විගණන හා කළමණාකරන කමිටුව විසින් 2017වසරේ දී ගෙන ඇති වැදගත් තීරණ පහත පරිදි වේ.

- පවතින පිළිවෙත් හා පද්ධති පිළිබඳව විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු හා දුර්වලතාවයන් මහහරවාගෙන පිළිවෙත් හා පද්ධති ශක්තිමත් කිරීම.

- රජයේ විගණන විමසුම් හා කෙටුම්පත් පිළිතුරු සමාලෝචනය කර පිළිතුරු සැකසීමේ ක්‍රමවේදය විධිමත් කිරීම.

- විගණන සැලසුම් හා විගණන වැඩසටහන සමාලෝචනය කිරීම හා එය ක්‍රියාක්මක කිරීමට අවශ්‍ය මහපෙන්වීම ලබා දීම.

- අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය හා අනෙකුත් කාර්යයන් ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

පෙරවදන

2017 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

සමාලෝචනයට ලක්වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට මහා භාණ්ඩාගාරයෙන්, අමාත්‍යාංශයෙන් සහ ආංශික නිපුණතා සංවර්ධන අංශය සහ වෙනත් ආයතනයන් මගින් රු. 2,103,412,397.13 ක සම්පූර්ණ මූල්‍ය ප්‍රදානයක් ලබා දී ඇත.

ඊට අමතරව, වෘත්තීය පුහුණු අධිකාරිය විසින් සිය ආදායම් අර්ධකාලීන පාඨමාලා මගින් උපයාගෙන ඇත. විස්තර පහතින් දක්වා ඇත.

1.1 රජයේ ප්‍රදාන	වෙන් කිරීම් (රු.)	ලබා දුන් මුදල (රු.)
භාණ්ඩාගාර ලැබීම් - පුනරාවර්ථන	1,305,195,000.00	1,243,627,000.00
අමාත්‍යාංශය - පුනරාවර්ථන	150,000,000.00	124,146,500.00
ආදායම	10,000,000.00	42,808,491.56
EPF සහ ETF සඳහා විශේෂ දීමනා (2006 – 2015)	67,746,000.00	67,746,000.00
භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධන	160,000,000.00	141,000,000.00
ආංශික නිපුණතා සංවර්ධන අංශය	799,000,000.00	431,917,607.54
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය	52,320,000.00	23,215,188.46
වෙනත්	28,951,609.57	28,951,609.57
එකතුව	**2,573,212,609.57**	**2,103,412,397.13**

2017 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය පහත සඳහන් සංයුක්තයන් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

මූල්‍ය ප්‍රකාශයේ සංරචකයන් :

01. 2017 දෙසැම්බර් 31 ට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
02. 2017 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය
03. 2017 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
04. 2017 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් සඳහා ප්‍රකාශය
05. මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්



.....

එච්. යූ. කාරියවසම්
අධ්‍යක්ෂ (මූල්‍ය)



.....

චූලාංගනී පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්



.....

ඉංජිනේරු ආචාර්ය ලයනල් පින්ටෝ
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී

2017 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2017 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පනත හා 1971 අංක 38 දරන මූල්‍ය පනතේ නිර්දේශයන් සහ ආකාරයන් අනුව සකස් කර ඇත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් අනුමත කර ඇති මූල්‍ය නීති සහ ක්‍රියාපරිපාටීන් අනුගමනය කර ඇති අතර, වත්කම් ආරක්ෂා කිරීම සහ ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ගණුදෙනු කටයුතු සිදු කිරීම තහවුරු කිරීමට පද්ධති හා පාලන හැකිතාක් දුරට ප්‍රායෝගික ලෙස පවත්වාගෙන ඇත. 2017 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශයන් සතුටුදායක අන්දමින් සකස් කර ඇති අතර, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බව මාගේ හැඟීමයි.





....

සභාපති / ප්‍රධාන විධායක නිලධාරී මණ්ඩලයේ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 

දිනය:- මණ්ඩලයේ අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2017 (රු)		2016(රු)	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල,පිරියත සහ උපකරණ	2	5,227,442,549.68		5,330,639,585.32	
ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ	3	211,008,032.78		90,229,551.49	
වෙනත් මූල්‍ය වත්කම්					
ස්ථාවර වත්කම්			5,438,450,582.46	25,000.00	5,420,894,136.81
ජංගම වත්කම්					
ඉන්වෙන්ටරි	4	28,614,548.21		28,570,273.97	
ලැබීම්	5	90,640,452.75		32,781,572.35	
සේවක ණය	6	47,151,819.23		44,838,181.41	
මුදල් හා බැංකු ශේෂය	7	62,377,124.97	228,783,945.16	158,485,123.25	264,675,150.98
මුළු වත්කම්			5,667,234,527.62		5,685,569,287.79
මූලධනය සහ වගකීම්					
සමුච්චිත අතිරික්තය / හිඟය		(800,736,885.49)		(662,725,978.73)	
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය		2,319,991,544.97		2,319,991,544.97	
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	8	13,472,995.59		41,073,032.86	
විලම්භිත ආදායම් ප්‍රදාන	9	3,612,371,847.75	5,145,099,502.82	3,525,654,108.23	5,223,992,707.33
ජංගම නොවන වත්කම්					
පාරිතෝෂිකයන් සඳහා ප්‍රතිපාදන	10	369,317,480.50	369,317,480.50	306,151,954.50	306,151,954.50
ජංගම වගකීම්					
ගෙවීම්	11	115,635,953.30		130,078,518.69	
සමුච්චිත වියදම්	12	37,181,591.00	152,817,544.30	25,346,107.27	155,424,625.96
TOTAL EQUITY & LIABILITIES			5,667,234,527.62		5,685,569,287.79

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධනය සඳහා ප්‍රකාශය

(ස්වභාවයෙන් වියදම් වර්ගීකරණය කිරීම සන්නිදර්ශනය කිරීම)

විස්තරය	සටහන	2017 (රු.)	2016 (රු.) (නැවත සඳහන් කළ)
මෙහෙයුම් ආදායම			
පුනරාවර්ථන ප්‍රදාන - භාණ්ඩාගාරය		1,311,373,000.00	1,286,473,000.00
පුනරාවර්ථන ප්‍රදාන - අමාත්‍යාංශය		124,146,500.00	
විලම්භීත ආදායම් ප්‍රදාන		391,658,290.56	397,269,169.33
වෙනත් ආදායම්			
වෙනත් ආදායම්	13	15,585,489.59	162,511,058.88
නිසෂ්පාදන ඒකක ආදායම (ශුද්ධ)	14	27,223,001.97	16,654,668.05
විශේෂ ව්‍යාපෘති සඳහා ලද ආදායම	15	170,201,432.45	183,442,634.76
මුළු ආදායම		2,040,187,714.57	2,046,350,531.02
මෙහෙයුම් වියදම්			
කාර්ය මණ්ඩල වියදම	16	1,178,946,782.88	1,029,757,756.74
ගමනාගමනය	17	16,854,072.80	12,635,948.30
සැපයුම් සහ භාවිත කළ පරිභෝජන ද්‍රව්‍ය	18	38,894,473.76	31,200,501.73
නඩත්තුව	19	31,781,580.92	34,147,205.06
ගිවිසුම්ගත සේවා	20	162,318,073.91	146,287,710.67
පුහුණු ද්‍රව්‍ය		108,104,905.28	92,250,834.64
කාර්ය මණ්ඩල පුහුණු කිරීම		3,159,306.60	4,276,341.81
ප්‍රවර්ධන සහ වෘත්තීය මාර්ගෝපදේශනය		18,764,912.42	15,111,270.23
රැකියාගත කිරීම, පරියේෂණ සහ ව්‍යවසායකත්වය	21	12,187,281.00	12,556,755.36
විස්තරය		391,658,290.56	397,269,169.33
වෙනත් මෙහෙයුම් වියදම්	22	39,268,294.68	53,927,245.60
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම	23	170,201,432.45	183,442,634.76
මූල්‍ය වියදම	24	163,513.16	207,089.01
සම්පූර්ණ මෙහෙයුම් ආදායම්		2,172,302,920.42	2,013,070,463.24
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය)		(132,115,205.85)	33,280,067.78
සමුච්චිත අතිරික්තය / හිඟය ප්‍රකාශන			
පෙර වාර්තා කළ පරිදි ජනවාරි 1 දිනට		(662,725,978.73)	(752,188,530.98)
පෙර වර්ෂයේ ගැලපීම්	25	(5,895,700.91)	56,182,484.47
නැවත සඳහන් කළ පරිදි ජනවාරි 1 දිනට		(668,621,679.64)	(696,006,046.51)
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය (හිඟය)		(132,115,205.85)	33,280,067.78
දෙසැම්බර් 31 දිනට ශේෂය		(800,736,885.49)	(662,725,978.73)

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
2017 දෙසැම්බර් 31 න් අවසන්වන වර්ෂය සඳහා

	2017 (රු.)		2016 (රු.)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය		(132,115,205.85)		33,280,067.78
පෙර වර්ෂයේ ගැලපීම්				
සකස් කිරීම් :				
ක්ෂය වීම්	391,658,290.56		397,269,169.33	
විලම්භිත ආදායම් ප්‍රදානවල ක්‍රමක්ෂය	(391,658,290.56)		(397,269,169.33)	
පාරිතෝෂික දීමනා	74,985,951.80		(56,687,929.47)	
පාරිතෝෂික ගෙවීම්	(11,820,425.80)		(10,984,024.03)	
පෙර වසරේ ගැලපුම්	(5,895,700.91)		56,182,484.47	
ගෙවීම්වල ඉහළයාම් / පහළ යාම්	(57,858,880.40)		(4,923,174.12)	
සේවක ණයවල ඉහළ යාම්/ පහළ යාම්	(2,313,637.82)		525,562.25	
ගෙවීම්වල ඉහළයාම් / පහළ යාම්	(14,442,565.39)		39,302,739.98	
සමුච්චිත වියදමේ ඉහළ යාම් / පහළ යාම්	11,835,483.73		4,358,339.59	
ඉන්වෙන්ටරිවල ඉහළ යාම් /පහළ යාම්	(44,274.24)	(5,554,049.03)	1,756,058.34	29,530,057.01
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		(137,669,254.88)		62,810,124.79
ආයෝජන ක්‍රියාකාරකම්				
දේපල, පිරියත සහ උපකරණ මිළදී ගැනීම.	(289,613,789.28)		(468,772,908.25)	
ප්‍රගතියේ පවතින වැඩ	(120,778,481.29)		38,690,795.58	
ස්ථාවර තැන්පතු	25,000.00			
ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		(410,367,270.57)		(430,082,112.67)
මූල්‍ය ක්‍රියාකාරකම්				
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	141,000,000.00		111,500,000.00	
වෙනත් ආදායම් ප්‍රදාන	310,928,527.17		323,520,112.10	
මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		451,928,527.17		435,020,112.10
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම / අඩු වීම		(96,107,998.28)		67,748,124.22
කාලය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		158,485,123.25		90,736,999.03
කාලය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ		62,377,124.97		158,485,123.25

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2017 දෙසැම්බර් 31 න්අවසන්වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රජයේ ප්‍රදාන -ප්‍රාග්ධන	විලම්භීත ආදායම් ප්‍රදාන	ප්‍රත්‍යාගණන අතිරික්තය	මුළු එකතුව
2016 ජනවාරි 01 දිනට ශේෂය	**(752,188,530.98)**	**36,138,943.05**	**3,492,008,442.35**	**2,319,991,544.97**	**5,095,950,399.39**
ආරම්භක ශේෂ සකස් කිරීම්	**56,182,484.47**				**56,182,484.47**
නැවත සඳහන් කළ ආරම්භක ශේෂය	**(696,006,046.51)**	**36,138,943.05**	**3,492,008,442.35**	**2,319,991,544.97**	**5,152,132,883.86**
වර්ෂය තුළ ලද ආදායම		**111,500,000.00**			**111,500,000.00**
විලම්භීත ආදායම් ප්‍රදානවලට මාරු කළ මුදල		**(106,565,910.19)**	**430,086,022.29**		**323,520,112.10**
වර්ෂය සඳහා ක්‍රමක්ෂය			**(397,269,169.33)**		**(397,269,169.33)**
වර්ෂය සඳහා අතිරික්තය / හිඟය	**33,280,067.78**				**33,280,067.78**
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(662,725,978.73)**	**41,073,032.86**	**3,524,825,295.31**	**2,319,991,544.97**	**5,223,163,894.41**
2017 ජනවාරි 01 දිනට ශේෂය	**(662,725,978.73)**	**41,073,032.86**	**3,524,825,295.31**	**2,319,991,544.97**	**5,223,163,894.41**
ආරම්භක ශේෂය සකස් කිරීම්	**(5,895,700.91)**	**(1,152,534.36)**	**828,812.92**		**(6,219,422.35)**
නැවත සඳහන් කළ ආරම්භක ශේෂය	**(668,621,679.64)**	**39,920,498.50**	**3,525,654,108.23**	**2,319,991,544.97**	**5,216,944,472.06**
වර්ෂය තුළ ලද ආදායම		**141,000,000.00**			**141,000,000.00**
විලම්භීත ආදායම් ප්‍රදානවලට මාරු කළ මුදල		**(167,447,502.91)**	**478,376,030.08**		**310,928,527.17**
වර්ෂය සඳහා ක්‍රමක්ෂය			**(391,658,290.56)**		**(391,658,290.56)**
වර්ෂය සඳහා අතිරික්තය / හිඟය	**(132,115,205.85)**				**(132,115,205.85)**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(800,736,885.49)**	**13,472,995.59**	**3,612,371,847.75**	**2,319,991,544.97**	**5,145,099,502.82**

01 - ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.0 සංයුක්ත තොරතුරු

1.1 ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය 1995 අංක 12 පනත යටතේ ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

1.2 මෙම ආයතනයේ ප්‍රධාන ස්ථානය පිහිටා ඇත්තේ, අංක 354 / 2, "නිපුණතා පියස", ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේය.

1.3 අධිකාරියේ ප්‍රධාන කාර්යය වනුයේ, වර්ෂය පුරා සිසුන්හට වෘත්තීය පුහුණුව ලබා දීමයි.

1.4 සාමාන්‍ය ප්‍රතිපත්තීන්

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය ප්‍රකාශනයන් සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන් සමඟ ශුද්ධ වත්කම්වල වෙනස්කම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා වරලත් ගිණුම්කරණ ආයතනයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්වලට අනුකූලව සකස් කර ඇත.

1.4.2 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතීන් පදනම් කර පිළියෙළ කර ඇත.

1.4.3 සැසඳුම් තොරතුරු

අධිකාරිය විසින් යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, පෙර වර්ෂයේ භාවිතා කළ ඒවාට ගැලපීම් කර ඇත. වර්තමාන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වන පරිදි අවශ්‍ය අවස්ථාවන්හිදී, පෙර වර්ෂයේ අගයන් සහ බාංඩයන් නැවත සකස් කර ඇත.

1.4.4 පිටු අංක 04 – 25 හි මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්, මූල්‍ය ප්‍රකාශනයන්වල අන්තරික කොටසක් ලෙස සකස් වී ඇත.

1.4.5 ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රකාශනයන්වල ඉදිරිපත් කර ඇති අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ. වැදගත් මූල්‍ය ප්‍රතිපත්තීන් පහත පෙන්නුම් කර ඇත.

1.4.6 ශේෂ පත්‍ර දිනයට පසු අවස්ථා
සකස් කිරීම් හෝ ගිණුම්වල හෙළිදරව් කිරීම් අවශ්‍ය දිනය ශේෂ පත්‍ර දිනය බැවින් අවස්ථාවන් පැන නොනැගිණි.

1.5 බදුකරණය

අධිකාරිය විසින් රජයේ ආධාර මත ක්‍රියාත්මකවන දෑ මගින් ලාභ ඉපැයීමට අපේක්ෂා නොකරන බැවින්, ආදායම් සඳහා බදු සකස් කර
නොමැත.

1.5.1 විලම්භිත බදු

අධිකාරියේ බදු ප්‍රතිපත්තිය අනුව කාලයන් වෙනස්වීම සඳහා බලපාන බදු පැන නොනැගිණි. එමනිසා විලම්භිත බදුකරණය සපයා නොමැත.

1.5 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිණුම් පදනම්

1.6.1 දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම.

දේපල, පිරියත සහ උපකරණ යන අයිතමයක වියදම හඳුනා ගත යුත්තේ,

අ)වත්කම් ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ අනාගතයේ වෘත්තීය පුහුණු අධිකාරිය වෙත සම්ප්‍රේෂණය වනවිට,

ආ) වෘත්තීය පුහුණු අධිකාරියේ වත්කම් පිරිවැය විශ්වසනීය ලෙස මිණුම් කළ හැකිවිටය.

වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රාග්ධන සීමාව රු. 2,000 /- කි. කෙසේවුවද, දේපල, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම ප්‍රාග්ධන සීමාව මත පමණක් රඳා නොපවතින අතර, පහත සඳහන් කරුණුද සලකා බලනු ලැබේ.

(i) වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය
(ii) වත්කමේ අපේක්ෂිත අරමුණ
(iii) වත්කමේ කල්පැවැත්ම
(iv) වත්කම පරිභෝජනය කළ හැකිද / නොහැකිද යන අවස්ථාවන්හිදීය.

1.6.2 ඉන්වෙන්ටරි

යල් පැන ගිය සහ මන්ද වලන අයිතමයන් සඳහා නියමිත දීමනා සකස් කළ පසු අවම වියදම් සහ ශුද්ධ උපලබ්ධි අගය අනුව ඉන්වෙන්ටරි ගණනය කර ඇත. ඉන්වෙන්ටරි වර්තමාන පිහිටීමට සහ තත්වයට ගෙන ඒමට වියදම් කළ පිරිවැය පහත ආකාරයට FIFO පදනම මත ගණනය කර ඇත.

1. පුහුණු ද්‍රව්‍ය	-	පිරිවැයේදී
2. ලිපිද්‍රව්‍ය	-	පිරිවැයේදී
3. අමුද්‍රව්‍ය (මුද්‍රණ)	-	පිරිවැයේදී
4. වෙනත් පාරිභෝගික දෑ	-	පිරිවැයේදී

1.6.3. දේපල, පිරියත සහ උපකරණ

a) පිරිවැය හෝ අඩු සමුච්චිත ක්ෂයවීම් අගය මත දේපල, පිරියත සහ උපකරණ සඳහන් කර ඇත. දේපල, පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයන් ප්‍රතිස්ථාපනය, අපහරණය හෝ එය භාවිතයෙන් ඉදිරි ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවන් මත නැවත පිළිගෙන ඇත. වත්කම් නැවත පිළිගැනීමෙන් සිදුවන යම් ලාභ සහ හානි වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කර ඇත. වත්කම නැවත පිළිගෙන ඇත.

b) **ක්ෂය වීම්**

මිළදී ගත් වර්ෂයේ ක්ෂය වීම් අනුව ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත. පහත සඳහන් ක්ෂයවීමේ අගයන් යොදාගෙන ඇත.

ඛාණ්ඩය	%
ගොඩනැගිලි සහ දියුණු කිරීම්	5%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	25%
ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	10%
පුහුණු උපකරණ	20%
යන්ත්‍ර සහ පිරියත	20%
පරිගණක උපකරණ	20%
විදුලි උපකරණ	20%

c) සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යන් වැඩ වියදම් අනුව තක්සේරු කළ ව්‍යාපෘතීන් සම්පූර්ණ කර ඇත.

1.6.4 ලැබීම්

අවබෝධ කර ගැනීමට ඇස්තමේන්තු කළ මුදල්, නරක් වූ සහ සැකසහිත ලැබීම් සඳහා ප්‍රතිපාදනවල ශුද්ධ අගය මත ලැබීම් සඳහන් කර ඇත. දින 365 ඉක්මූ ණය වීම මත සැක සහිත ණය සඳහා ප්‍රතිපාදන සකස් කිරීම සිදු කර ඇත. එසේම, සම්පූර්ණ මුදලේ එකතුවේ සැකය ලෙස ගණනය වේ.

1.6.5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ බැංකුවේ පවතින මුදල් සහ අතැති මුදල් සහ ස්ථාවර බැංකු අයිරාවන්ය. වගකීම් සහ විධි විධානයන්

1.7.1 සියළුම දන්නා වගකීම් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම තුළ ගණන් ගෙන තිබේ.

1.7.2 කාර්ය මණ්ඩලයේ විශ්‍රාම පාරිතෝෂිකය

සියළුම සේවකයන්ට අදාළව සේවයෙහි සෑම සම්පූර්ණ කළ අවුරුද්දකම මාසික වැටුපෙන් අර්ධයක් පදනම් කර විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා සුදුසුකම් ගණනය කර ඇත.

කෙසේවුවද, 1983 අංක 12 දරන පනතේ පාරිතෝෂික ගෙවීම අනුව, සේවාවේ අවුරුදු 5 සම්පූර්ණ කිරීම මත පමණක් සුදුසුකම් පැන නගී.

පාරිතෝෂික දීමනා සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය සම්පාදනය වන බැවින් මෙම දීමනා ප්‍රක්ෂේපිත මුදල් ඒකක ක්‍රමය මත තක්සේරු නොකෙරේ. මෙම දීමනාව සඳහා අරමුදල් නිර්මාණය නොකෙරේ.

1.7.3 අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාරත්ව අරමුදල

අදාළ නීතිවලින් සහ විධිවිධානයන් අනුව සේවකයන් සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයන් සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයන් සඳහා සුදුසකම් ලබයි.

1.7.4. රජයේ ආධාර සහ ප්‍රදානයන්

අ.) ආයතනය එහි වියදම් සඳහා යැපෙන රජයේ ආධාර රිසිටපත් පදනම මත ගණනය කෙරේ. පුණාරාවර්ථන වියදම් සම්බන්ධ ප්‍රදානයන්, ආදායමේ මුදල් ලෙස ඉදිරිපත් කර ඇති අතර, ප්‍රාග්ධන වියදම් සම්බන්ධ වියදම් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කර ඇත.

a) මූලික වශයෙන් වත්කම් සම්බන්ධව ප්‍රදානයන් සිදු කරන ආයතනයන්වලින් ලබන ප්‍රදානයන්, එය උපයෝජනය කරන තුරු බැරකමක් ලෙස පිළි ගැනේ. ප්‍රදානයන්ගෙන් උපයෝජනය කරන මුදල අර්ථ දක්වන ලද ආදායම් ගිණුමට හුවමාරු කරන ලද අතර, පසුව වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී හිලව් කරනු ලැබේ.

1.7.5 ප්‍රතිපාදන සහ ආවස්ථික වගකීම්

සම්පත්වල පිටත ගලා යාමක ප්‍රතිඵලයක් ලෙස යම් බැඳීමක් සිදු විය හැකි අවස්ථාවක සියළුම බැඳීම් සඳහා ප්‍රතිපාදනයන් පවතින ශේෂ පත්‍ර දිනයට සකස් කෙරෙන අතර, ගලනයේ කොටසකින් විශ්වාසදායි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි සියළුම ආවස්ථික පිරිවැටුම් සම්පත්වල පිටත ගලා යාම. දුරස්ථ නොවේ නම්, සටහන් අංක 27 යටතේ මූල්‍ය ප්‍රකාශයන්වල එය හෙළිදරව් කර ඇත.

1.8 ආදායම් වියදම් ප්‍රකාශය

1.8.1 ආදායම් හඳුනා ගැනීම.

අධිකාරිය වෙත ගලා ආ හැකි ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය මත ආදායම් හඳුනා ගන්නා අතර, වියදම් කර ඇති හෝ වියදම් කිරීමට පවතින ආදායම සහ ආශ්‍රිත වියදම් විශ්වාසදායක ලෙස මැණ බැලිය හැක. සැළකිය යුතු ලැබුණු දෑ හෝ ලැබීම්වල සාධාරණ අගය මත ආදායම් මැණ බැලේ.

ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිර්දේශිත නිර්ණායකයන් භාවිතා කෙරේ.

අ.) පුනරාවර්තන වියදම් සඳහා ලද ප්‍රදාන

පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් ආදායම ලෙස හඳුනා ගත හැක.

ආ.)මූලික වශයෙන් ප්‍රදානයන් සිදු කරනු ලබන ආයතනවලින් ලද ප්‍රදානයන් එය භාවිතා කරන තුරු පිරිවැටුමක් ලෙස පිළි ගැනේ. ප්‍රදානයන්ගෙන් උපයෝජනය කරනු ලබන මුදල, ආදායමට හුවමාරු කෙරේ.

ඇ.) පුහුණු පාඨමාලා වලින් ලද ආදායම

පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ ගාස්තු උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

ඈ.) ශිෂ්‍ය නිෂ්පාදන ඒකකයෙන් ලද ආදායම

ශිෂ්‍ය නිෂ්පාදන ඒකකයෙන් ලද ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

ඉ.)කුලී ආදායම

කුලි ආදායම කුලියට දුන් කාලය මත, උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

ඊ) අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

1.8.2 වියදම හඳුනා ගැනීම.

අ.)වියදම් කළ පිරිවැය සහ ආදායමේ නිර්දේශිත අයිතමයන්වල ඉපැයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කර ආදායම් සහ වියදම් ප්‍රකාශයේ වියදම් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ක්‍රියාකාරීත්වය සහ කාර්යක්ෂම ආකාරයකින් දේපල, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාමේදී දරන ලද වියදම් වර්ෂයේ ශුද්ධ අතිරික්තය සහ හිඟය කරා යාමේදී ආදායමට බැර කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

රුපියල් වලින්

	ඉඩම්	ගොඩනැගිලි සහ දියුණු කිරීම්	මෝටර් වාහන	ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	පුහුණු උපකරණ	කාර්යාල උපකරණ	විදුලි උපකරණ	පරිගණක උපකරණ	දේපල සහ යන්ත්‍ර සූත්‍ර	මුළු එකතුව
වියදම් හෝ අගය										
වර්ෂය ආරම්භයේ	1,758,758,726.44	3,331,745,320.70	299,509,825.43	272,959,665.54	1,942,455,990.29	114,892,740.94	8,644,825.81	466,282,179.84	91,906,195.27	**8,287,155,470.26**
වර්ෂය තුළ එකතු කිරීම්	2,098,601.37	39,077,657.79	1,747,450.00	48,802,977.63	149,408,709.20	2,289,256.15		30,608,190.00	14,428,412.78	**288,461,254.92**
වර්ෂය අවසානයේ	**1,760,857,327.81**	**3,370,822,978.49**	**301,257,275.43**	**321,762,643.17**	**2,091,864,699.49**	**117,181,997.09**	**8,644,825.81**	**496,890,369.84**	**106,334,608.05**	**8,575,616,725.18**
සමුච්චිත ක්ෂය වීම්										
වර්ෂය ආරම්භයේ		949,955,846.93	233,691,798.30	119,376,482.66	1,230,362,251.83	45,371,079.38	5,538,666.03	306,508,985.32	65,710,774.49	**2,956,515,884.94**
වර්ෂය සඳහා අය කිරීම්		121,043,356.58	16,891,369.28	20,238,616.05	172,300,489.53	14,362,183.54	621,231.96	38,076,276.90	8,124,766.71	**391,658,290.56**
වර්ෂය අවසානයේ		**1,070,999,203.51**	**250,583,167.58**	**139,615,098.71**	**1,402,662,741.36**	**59,733,262.92**	**6,159,897.99**	**344,585,262.22**	**73,835,541.20**	**3,348,174,175.50**
කපා දැමූ අගය										
2017 දෙසැම්බර් 31 දිනට	**1,760,857,327.81**	**2,299,823,774.98**	**50,674,107.85**	**182,147,544.46**	**689,201,958.13**	**57,448,734.17**	**2,484,927.82**	**152,305,107.62**	**32,499,066.85**	**5,227,442,549.68**
2016 දෙසැම්බර් 31 දිනට	**1,758,758,726.44**	**2,381,789,473.77**	**65,818,027.13**	**153,583,182.88**	**712,093,738.46**	**69,521,661.56**	**3,106,159.78**	**159,773,194.52**	**26,195,420.78**	**5,330,639,585.32**

ආරම්භක ශේෂයට ගැළපීම්

වියදම

වත්කම් වර්ගීකරණය	ගැළපීම් වලට පෙර ආරම්භක ශේෂය	සිදුකළ ගැළපීම්	ගැළපීම්වලට පසු ආරම්භක ශේෂය
මෝටර් වාහන	298,580,398.43	929,427.00	299,509,825.43
ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	272,736,558.18	223,107.36	272,959,665.54
මුළු එකතුව	**571,316,956.61**	**1,152,534.36**	**572,469,490.97**

විස්තරය

වත්කම් වර්ගීකරණය	ගැළපීම් වලට පෙර ආරම්භක ශේෂය	සිදුකළ ගැළපීම්	ගැළපීම්වලට පසු ආරම්භක ශේෂය
මෝටර් වාහන	233,459,441.55	232,356.75	233,691,798.30
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	119,285,117.97	91,364.69	119,376,482.66
මුළු එකතුව	**352,744,559.52**	**323,721.44**	353,068,280.96

2.2 තක්සේරු නොකළ ඉඩම් සහ ගොඩනැගිලි

1. තක්සේරු කර නොකර ඇති බැවින්, පහත සඳහන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ඉඩම් සහ ගොඩනැගිලි වාර්ෂික ගිණුම්වල ඇතුළත් වී නොමැත.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මාතලේ - මාතලේ
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යක්කලමුල්ල - මාතලේ - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගිනිමැල්ලගහ - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - අක්මීමණ - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - චතුරවිල - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කටාන - ගම්පහ
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කිරින්ද - හම්බන්තොට
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - සිරබෝපුර - හම්බන්තොට

ඉහත සඳහන් ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරු කිරීම් සිදු කෙරෙමින් පවතින අතර, තක්සේරුවන් ලබා ගත් පසු, එම අගයන් 2018 වසර සඳහා ගිණුම්ගත කෙරෙනු ඇත.

2. වෘත්තීය පුහුණු අධිකාරියට අයත් නොවන ඉඩම්වල නිපුණතා සංවර්ධන අරමුදලේ ආධාර මගින් පහත සඳහන් ගොඩනැගිලි ඉදි කෙරේ. ඉහත ඉඩම්වල සහ ගොඩනැගිලිවල තක්සේරු කිරීම් 2018 වසරේදී ඇතුළත් වනු ඇත.

- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - බිංගිරිය - කුරුණෑගල - හම්බන්තොට
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වේයන්ගොඩ - ගම්පහ
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යක්කලමුල්ල - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - නියාගම - ගාල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රුවන්වැල්ල - කෑගල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කන්තලේ - ත්‍රිකුණාමලය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හම්බන්තොට - හම්බන්තොට
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වස්කඩුව - කළුතර
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හල්දුම්මුල්ල - බදුල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වැලිමඩ - බදුල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වැල්ලවාය - මොණරාගල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - බිබිල - මොණරාගල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මිහින්තලේ - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - ගල්නෑව - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - තඹුත්තේගම - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රාජාංගනය - අනුරාධපුරය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - මින්නේරිය - පොළොන්නරුව
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - යටියන්තොට - කෑගල්ල
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කිලිනොච්චිය - යාපනය
- වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - රත්මලාන - කොළඹ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

		සටහන	2017		2016
			රු.		රු.
3	**ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ - ගොඩනැගිලි**				
	අම්පාර		99,442.00		99,442.00
	අනුරාධපුරය		17,636,270.56		3,216,293.70
	බදුල්ල		5,980,021.34		475,778.37
	මඩකලපුව		158,850.00		158,850.00
	කොළඹ		2,811,638.29		4,108,793.41
	ගම්පහ		15,451,056.64		5,113,792.27
	ගාල්ල		54,125,144.87		17,511,596.07
	හම්බන්තොට		19,053,095.65		18,893,980.70
	යාපනය		5,372,084.95		4,881,477.70
	මහනුවර		597,183.96		651,415.23
	කළුතර		11,803,640.99		4,556,090.07
	කෑගල්ල		11,006,826.00		4,451,260.57
	කුරුණෑගල		11,197,276.48		5,892,496.36
	මාතර		431,662.03		273,395.00
	මාතලේ		5,186,260.25		-
	මොණරාගල		27,280,161.07		5,970,380.77
	නුවර එළිය		14,857,478.63		7,965,454.41
	රත්නපුරය		7,959,939.07		6,009,054.86
			211,008,032.78	**#**	**90,229,551.49**
4	**ඉන්වෙන්ටරි**				
	පුහුණු ද්‍රව්‍ය		21,156,683.90		21,916,262.21
	ලිපි ද්‍රව්‍ය		6,050,791.05		5,904,978.19
	වෙනත් පරිභෝජන ද්‍රව්‍ය		1,407,073.26		749,033.57
			28,614,548.21	**#**	**28,570,273.97**
5	**ලැබීම්**				
	වැඩසටහන් සඳහා අත්තිකාරම්		60,250.00		344,105.00
	ඉඩම් සඳහා අත්තිකාරම්		18,032,000.00		
	ඉදි කිරීම් සඳහා ජංගම අත්තිකාරම්		51,104,293.87		
	තැන්පතු		559,750.00		559,750.00
	වෘත්තීය පුහුණු අමාත්‍යාංශය		3,548,334.94		3,930,931.24
	පාඨමාලා ගාස්තු ලැබීම්		17,141,025.00		19,458,199.10
	වැටුප් ලැබීම්		355,573.67		679,882.55
	ආදායම් ඌණතාවය		11,732.00		11,732.00
	රාජ්‍ය ආයතනයන්		1,964,635.71		3,035,710.16
	වෙළඳ සහ වෙනත් ලැබීම්		3,233,673.21		11,266,498.70
	වාහන සේවා කිරීමේ ආදායම් ලැබීම්		142,155.00		461,405.00
			96,153,423.40	**#**	**39,748,213.75**
	අඩු කළා - බොල් ණය සඳහා ප්‍රතිපාදන		**(5,512,970.65)**		**(6,966,641.40)**
			90,640,452.75	**#**	**32,781,572.35**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
6	**සේවක ණය**			
	වසර ආරම්භයේ ශේෂය		44,838,181.41	45,363,743.66
	එකතු කළා - වසර තුළ ප්‍රදානය කළ ණය		48,626,012.02	45,279,105.65
			93,464,193.43	90,642,849.31
	අඩු කළා - වසර තුළ නැවත ගෙවීම්		(46,312,374.20)	(45,804,667.90)
	වසර අවසානයට ශේෂය		**47,151,819.23**	**44,838,181.41**
7	**මුදල් සහ මුදල් සමාන දෑ**			
	රන් කාසි		104,000.00	104,000.00
	බැංකුවේ මුදල්			
	අතැනි මුදල්		30,120.00	35,545.00
	අතැනි වෙක්පත්		123,600.50	487,160.00
	මහජන බැංකුව		62,119,404.47	157,858,418.25
			62,377,124.97	**158,485,123.25**

7.1 සෙලාන් බැංකුවේ ප්‍රදානයක් ලෙස අධිකාරිය විසින් රන් කාසි 02 ක් ලබාගෙන ඇත. එක් රන් කාසියක් ග්‍රෑම් 8.02 ක් බර අතර, එක් රන් කාසියක වටිනාකම කැරට් 22.03 කි.

8	**රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන**			
	වසර ආරම්භයේ ශේෂය		41,073,032.86	36,138,943.05
	අඩු කළා - ආරම්භක ශේෂ එකතු කිරීම්		(1,152,534.36)	
	නැවත සඳහන් කළ පරිදි ශේෂය		**39,920,498.50**	**36,138,943.05**
	එකතු කළා - වසර තුළ ලැබීම්		141,000,000.00	111,500,000.00
			180,920,498.50	**147,638,943.05**
	අඩු කළා - විලම්භීත ආදායම් ප්‍රධානවල මාරු කිරීම්		(167,447,502.91)	(106,565,910.19)
	වසර අවසානයට ශේෂය		**13,472,995.59**	**41,073,032.86**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
9	**විලම්බිත ආදායම් ප්‍රධාන**			
	වසර ආරම්භයට ශේෂය		3,525,654,108.23	3,492,008,442.35
	එකතු කළා - වසර තුළ මාරුවීම්	9.1	478,376,030.08	430,086,022.29
			4,004,030,138.31	**3,922,094,464.64**
	අඩු කළා - වසර සඳහා ක්‍රමක්ෂය		(391,658,290.56)	(397,269,169.33)
	එකතු කළා - ආරම්භක ශේෂ එකතු කිරීම්			828,812.92
	වසර අවසානයට ශේෂය		**3,612,371,847.75**	**3,525,654,108.23**

9.1 විලම්බිත ආදායමට මාරු කිරීම

රජයේ ප්‍රධාන - ප්‍රාග්ධන	167,447,502.91	106,565,910.19
SSDP ප්‍රධානයන්	287,031,140.77	261,642,279.75
වෙනත් ප්‍රධානයන්	23,897,386.40	61,877,832.35
	478,376,030.08	**430,086,022.29**

10	**පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**		
	වසර ආරම්භයේ ශේෂය	306,151,954.50	373,823,908.00
	එකතු කළා - ආරම්භක ශේෂ ගිණුම		(56,687,929.47)
	නැවත සඳහන් කළ පරිදි ශේෂය	306,151,954.50	317,135,978.53
	එකතු කළා - වසර තුළ ප්‍රතිපාදන	74,985,951.80	
		381,137,906.30	**317,135,978.53**
	අඩු කළා - වසර තුළ ගෙවීම්	(11,820,425.80)	(10,984,024.03)
	වසර අවසානයට ශේෂය	**369,317,480.50**	**306,151,954.50**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
11	ගෙවීම්			
	විගණන ගාස්තු		1,493,435.00	993,435.00
	අයකැමි තැන්පතු		-	25,000.00
	පාඨමාලා ගාස්තු ගෙවීම්		801,552.40	4,047,151.40
	තැන්පතු		111,000.00	128,500.00
	සේවක අර්ථසාධක අරමුදල		15,175,420.51	15,515,306.90
	සේවක භාරකාර අරමුදල		2,276,313.78	2,327,296.34
	දේශක ගාස්තු		6,719,687.50	3,091,600.00
	වෙනත් ගෙවීම්		7,668,475.42	11,849,030.05
	ව්‍යාපෘති අරමුදල් ගෙවීම්		14,114,848.97	21,028,772.00
	අත්තිකාරම් වශයෙන් ලැබීම්		544,575.00	798,200.00
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		1,621,303.51	2,049,356.51
	රඳවා ගැනීමේ මුදල්		20,474,765.13	23,928,862.47
	වැටුප් ගෙවීම්		1,328,976.79	287,607.05
	කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම්		124,050.00	38,200.00
	ශිෂ්‍ය රක්ෂණ ක්‍රමය	11.1	37,883,500.00	38,354,000.00
	වෙළඳ ණයකරුවන්		5,186,177.93	3,691,563.32
	ජංගම දුරකථන වෙන් කිරීම්			1,818,537.09
	W & O.P		111,871.36	106,100.56
			115,635,953.30	**130,078,518.69**

11.1 සිසු රක්ෂණ ක්‍රමය

වසර ආරම්භයට	38,354,000.00	**24,905,500.00**
එකතු කළා - වසර තුළ දායකත්වය	37,000.00	13,948,500.00
	38,391,000.00	**38,854,000.00**
අඩු කළා - වසර තුළ ගෙවීම්	(507,500.00)	(500,000.00)
වසර අවසානයට ශේෂය	**37,883,500.00**	**38,354,000.00**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
12	**සමුච්චිත වියදම්**			
	වෘත්තීය මාර්ගෝපදේශනය		167,930.00	171,190.00
	විදුලි බලය		2,704,517.47	2,188,615.30
	විභාග සහ ඇගයීම්		343,142.00	677,400.00
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		99,000.00	8,903.00
	සනීපාරක්ෂක සේවාවන්		1,164,190.00	602,937.40
	නඩත්තුව		1,888,912.81	2,017,703.72
	පුවත්පත් සහ වාර සඟරා		15,770.00	30,760.00
	සේවාස්ථ පුහුණුව සඳහා ගෙවීම්		153,500.00	42,500.00
	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්		970,857.54	1,052,956.89
	අර්ධකාලීන වියදම් ගෙවීම්		19,092,252.77	4,931,902.90
	ප්‍රවර්ධන කටයුතු		350,901.00	3,236,096.57
	කුලී, වරිපනම් සහ බදු		299,025.84	334,468.17
	වාර ප්‍රවේශ පත්‍ර		1,503,392.24	781,266.90
	ආරක්ෂක ගාස්තු		3,261,194.82	3,794,772.20
	දීමනා		2,509,000.00	1,869,300.00
	දුරකථන		1,398,632.46	2,750,772.62
	ප්‍රවාහනය		34,000.00	65,900.00
	ගමනාගමනය		663,254.10	524,881.95
	ජලය		562,117.95	263,779.65
			37,181,591.00	**25,346,107.27**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
13	**වෙනත් ආදායම්**			
	වෙන්දේසි ආදායම්		1,907,145.18	2,147,364.50
	පාඨමාලා ගාස්තු		1,782,800.00	131,818,200.00
	ආපනශාලා ආදායම්		247,625.00	235,900.00
	සමාගම් ලියාපදිංචිය		66,500.00	54,000.00
	දෛනික කටයුතු		2,000.00	3,225,000.00
	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්		134,000.00	66,000.00
	දඩ		766,404.86	61,956.00
	ශාලා ආදායම		1,224,450.00	2,005,430.00
	නේවාසිකාගාර ගාස්තු		286,500.00	223,500.00
	කතරගම සංචාරක බංගලාව		439,230.00	446,585.00
	ණය පොළී		1,892,726.47	1,765,256.36
	විවිධ		2,200,308.00	2,219,406.44
	ආපසු නොගෙවූ ටෙන්ඩර් තැන්පතු		506,500.00	791,500.00
	වාර්තා පොත්		5,000.00	5,629,600.00
	ලියාපදිංචි ගාස්තු		34,800.00	8,952,300.00
	නිමැවුම් භාණ්ඩ විකිණීම		358,352.85	287,098.75
	ඉතිරුම් ගිණුම් පොළී		1,661,747.23	1,455,361.83
	සැපයුම්කරුවන් ලියාපදිංචිය		944,500.00	519,400.00
	ඉංග්‍රීසි පොත් ආදායම්		580,200.00	607,200.00
	විභාග ගාස්තු		544,700.00	-
			15,585,489.59	**162,511,058.88**

		සටහන	2017	2016
			රු.	රු.
14	**නිෂ්පාදන ඒකක ආදායම**			
	ඉපැයුම් 10%		894,310.50	594,733.25
	අර්ධකාලීන පාඨමාලාවලින් ආදායම		17,920,717.96	8,098,127.27
	මුද්‍රණ පාසල - නාරාහේන්පිට		72,698.93	1,655,574.82
	පෙර ඉගෙනුම් හඳුනා ගැනීම.		7,484,909.48	5,257,709.43
	සිප්සල බොජුන් - නාරාහේන්පිට		-	16,446.50
	වෘත්තීය පරීක්ෂණ		23,444.00	16,500.00
	තලල්ල ආපන ශාලාව		96,709.31	**107,906.75**
	ටී -ෂර්ට් ආදායම		-	**181,450.00**
	වාහන සේවා කිරීම්		62,040.00	108,360.05
	වෙනත් නිෂ්පාදන ආදායම්		668,171.79	617,859.98
			27,223,001.97	**16,654,668.05**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන	2017	2016
		රු.	රු.
15	**විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර**		
	යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - උසස් පෙළ සිසුන් සඳහා වැඩසටහන	41,300.00	130,725.00
	නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය	141,890,720.82	153,114,359.42
	GIZ සඳහා ආධාර	74,260.00	609,531.99
	ILO සඳහා ආධාර	2,272,720.17	5,114,231.17
	අයවැය යෝජනා සඳහා ආධාර	23,215,188.46	23,608,531.18
	WUSC ව්‍යාපෘතිය සඳහා ආධාර	2,703,288.00	865,256.00
	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල සඳහා ආධාර	3,955.00	
		170,201,432.45	**183,442,634.76**
16	**සේවක ව්‍යදම්**		
	E.P.F. & E.T.F.	202,544,440.55	166,084,956.43
	වෙනත් දීමනා	341,168,211.00	404,872,812.05
	වැටුප් සහ අතිකාල	560,248,180.53	458,799,988.26
	සේවක පාරිතෝෂික	74,985,950.80	-
		1,178,946,782.88	**1,029,757,756.74**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
17	**ගමනාගමනය**			
	නවාතැන් වියදම්		473,310.00	653,293.00
	දේශීය		7,013,762.10	7,370,473.58
	විදේශීය		7,346,403.20	3,040,313.57
	භාණ්ඩ සමීක්ෂණ වියදම්		2,020,597.50	1,571,868.15
			16,854,072.80	**12,635,948.30**
18	**සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය**			
	තෙල් සහ ලිහිස්සුම් ද්‍රව්‍ය		15,619,887.73	13,553,344.51
	වෙනත්		2,012,302.04	2,017,800.99
	ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා		15,037,198.50	10,249,669.23
	මුද්‍රිත ද්‍රව්‍ය		6,225,085.49	5,379,687.00
			38,894,473.76	**31,200,501.73**
19	**නඩත්තුව**			
	ගොඩනැගිලි		11,575,232.28	10,426,012.39
	කාර්යාල උපකරණ		834,578.21	**0.00**
	දේපල සහ පිරියත		6,845,968.13	9,515,292.54
	වාහන		12,525,802.30	14,205,900.13
			31,781,580.92	**34,147,205.06**
20	**ගිවිසුම්ගත සේවාවන්**			
	වෙළඳ දැන්වීම්		4,318,234.50	4,429,622.25
	විගණන ගාස්තු		500,000.00	500,000.00
	උපදෙස් සහ වෘත්තීය ගාස්තු		707,201.93	960,000.00
	විදුලි බලය		49,697,300.81	47,614,556.80
	කුලී ගාස්තු		3,851,087.32	400,000.00
	රක්ෂණය		3,578,375.74	2,779,876.62
	සනීපාරක්ෂක සේවාවන්		11,844,076.00	8,755,895.04
	පුවත්පත් සහ වාර සඟරා		491,002.00	485,743.00
	තැපැල් ගාස්තු		1,270,647.10	1,328,322.97
	කුලී, වරිපනම් සහ බදු		7,576,249.70	7,316,886.85
	ආරක්ෂක ගාස්තු		38,504,707.03	36,180,587.36
	සේවක සුභසාධනය සහ වෙනත්		2,340,367.00	1,042,578.70
	දුරකථන ගාස්තු		23,730,250.74	21,883,045.90
	ප්‍රවාහනය		2,950,982.00	2,616,785.00
	ජලය		10,957,592.04	9,993,810.18
			162,318,073.91	**146,287,710.67**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
21	**රැකියා ගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය**			
	විෂයමාලා සංවර්ධනය		504,705.00	311,585.00
	සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය		9,107,155.00	9,526,318.00
	ව්‍යවසායකත්ව වැඩසටහන්		819,189.51	1,000,748.25
	රැකියාගත කිරීම		712,442.89	931,487.61
	පර්යේෂණ සහ අන්වේෂ්ය දීමනා		294,770.00	376,228.00
	පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය		749,018.60	410,388.50
			12,187,281.00	**12,556,755.36**
22	**වෙනත් මෙහෙයුම් වියදම්**			
	වට්ටම 10%		-	64,000.00
	පුහුණු පාඨමාලා සඳහා වට්ටම් වියදම් 50%		-	2,844,650.00
	විභාග සහ ඇගයීම්		3,644,629.00	6,190,224.46
	නොමිලේ පාඨමාලා සඳහා වියදම්		-	1,942,300.00
	ගෞරව දීමනා		647,600.00	1,040,200.00
	අනුමත හැරයාම්		-	3,074,889.00
	නෛතික ගාස්තු		172,250.00	185,250.00
	විවිධ		6,058,840.32	5,826,632.65
	තත්ත්ව කළමනාකරණ ප්‍රතිඵලය		2,294,508.07	1,950,254.30
	වාර ප්‍රවේශ පත්‍ර		5,733,874.03	5,245,260.94
	විශේෂ පුහුණු වැඩසටහන්		335,586.00	757,565.50
	වැටුප් දීමනා		19,341,763.00	22,022,263.45
	ආවුද සහ පරිභෝජන		992,384.26	2,431,255.30
	සිසුන්ගෙන් නොපියවූ රක්ෂණ		-	298,500.00
	නොපියවූ පාඨමාලා ගාස්තු		-	54,000.00
	පුහුණු අධීක්ෂණය		46,860.00	-
			39,268,294.68	**53,927,245.60**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2017	2016
			රු.	රු.
23	**විශේෂ ව්‍යාපෘති සඳහා සටහන්**			
	යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - උසස් පෙළ සිසුන් සඳහා වැඩසටහන		41,300.00	130,725.00
	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන		141,890,720.82	153,114,359.42
	GIZ සඳහා වියදම		74,260.00	609,531.99
	ILO සඳහා වියදම		2,272,720.17	5,114,231.17
	අයවැය යෝජනා සඳහා වියදම		23,215,188.46	23,608,531.18
	WUSC ව්‍යාපෘතිය සඳහා වියදම		2,703,288.00	865,256.00
	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල සඳහා ආධාර		3,955.00	
			170,201,432.45	**183,442,634.76**
24	**මූල්‍ය වියදම**			
	බැංකු අය කිරීම්		163,513.16	207,089.01
			163,513.16	**207,089.01**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

25. පෙර වර්ෂයේ ගැලපුම්

පහත සඳහන් වියදම්වල වැඩි සහ අඩු ප්‍රතිපාදන පෙර වර්ෂයේ ගැළපුම් ලෙස සකස් කරන ලදී.

විස්තරය	හර	බැර	ශුද්ධ ප්‍රතිඵලය
මුදල් රඳවා ගැනීම්		1,71969.10	
වාහන පුනරුජ්ථාපනය කිරීම.		929,427.00	
ජංගම දුරකථන සඳහා අත්තිකාරම් ගෙවීම්		1,818,537.09	
හැරයාම්	9,815,634.10		
මුළු මුදල	9,815,634.10	3,919,933.19	5,895,700.91

ඉහත ගැලපුම්වල ප්‍රතිඵලයක් ලෙස, 2016 වසර සම්බන්ධ රු. 33,280,067.78 අධිභාරය 2017 වසරේදී රු.27,384,366.87 ලෙස අඩුවනු ඇත.

26. **<u>වගකීම් සහ ආවස්ථිකයන්</u>**

අ. අධිකාරියට විරුද්ධ නඩු

පහත සඳහන් ආකාරයෙන් අධිකාරියට විරුද්ධව නඩු බල පැවැත්වේ.

අධිකරණය		
	2017.12.31	2016.12.31
ශ්‍රේෂ්ඨාධිකරණය	02	02
දිස්ත්‍රික් උසාවිය	01	02
කම්කරු විනිශ්චයාධිකාරී මණ්ඩලය	02	01
කම්කරු දෙපාර්තමේන්තුවේ විමර්ශනයන්	02	-
එකතුව	06	04

ආ. ප්‍රාග්ධන වගකීම්

2017.12.31 දිනට ද්‍රව්‍ය ප්‍රාග්ධන වගකීම් නොමැත.

27. **<u>භාවිතයට නොගත් වත්කම්වල වියදම් සඳහා ගැලපීම් කිරීම. (දේපල, පිරියත සහ උපකරණ)</u>**

2013, 2014, 2015, 2016 සහ 2017 වසරවල පවත්වන ලද වත්කම් සමීක්ෂණයන්වලදී වෙන්දේසි කළ යුතු භාණ්ඩ හඳුනාගෙන ඇත. 2014, 2015 සහ 2016 දී සමහර අයිතමයන් වෙන්දේසි සහ විනාශ කරන ලද අතර, එම භාණ්ඩවල පොත් අගය 2018 වසරේ දේපල, පිරියත සහ උපකරණ (ස්ථාවර වත්කම්) සඳහා ගලපනු ඇත.

28. <u>බොල් ණය ප්‍රතිපාදන</u>

රු. 5,512,970.65 ක් වූ බොල් ණය මුදල අතරින්, රු. 3,548,334.94 ක් යෙවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ ආරක්ෂක සේවා ලැබීම් වලින් ලැබීමට නියමිතය.

<u>29. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ව්‍යාපෘති ආධාර ගෙවීම්</u>

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ව්‍යාපෘතියෙන් පාඨමාලා ප්‍රතිනය සඳහා ප්‍රදානය කළ මුදලේ, 2014 වසරේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 10,427,341.81 කි. දැනට පාඨමාලා සම්බන්ධ උපකරණ මිළදී ගෙන ඇත. එමනිසා, එම උපකරණවල අගය 2018 වසර සඳහා ගලපනු ඇත.

<u>30. කාලය සඳහා ශුද්ධ ඌණතාවය</u>

2017 වසර සඳහා ප්‍රකාශයේ රු. මිලියන 132 ක ඌණතාවයක් ඇත. එම හිඟය සඳහා පහත කරුණු හේතුවේ.

1. වියදම් ලෙස පාරිතෝෂික ප්‍රතිපාදන රු. මිලියන 74 ක් දැනටමත් අඩු කර ඇත.
2. 2017 වසර සඳහා භාණ්ඩාගාරයෙන් නිකුත් කළ සම්පූර්ණ අරමුදල් අධිකාරියට නිදහස් කර නොමැත.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
2017 දෙසැම්බර් 31 ට ශේෂ පිරික්සුම

විස්තරය	Dr.	Cr.
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම.		
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අත්පත් කර ගැනීම.	1,760,857,327.81	
ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් අත්පත් කර ගැනීම.	3,370,822,978.49	
පරිගණක සහ උපකරණ අත්පත් කර ගැනීම.	496,890,369.84	
විදුලි උපකරණ අත්පත් කර ගැනීම.	8,644,825.81	
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් අත්පත් කර ගැනීම.	321,762,643.17	
මෝටර් වාහන අත්පත් කර ගැනීම.	301,257,275.43	
කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම.	117,181,997.09	
දේපල සහ පිරියත අත්පත් කර ගැනීම.	106,334,608.05	
පුහුණු උපකරණ අත්පත් කර ගැනීම.	2,091,864,699.49	
ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		
ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම්වල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		1,070,999,203.51
පරිගණක උපකරණවල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		344,585,262.22
විදුලි උපකරණවල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		6,159,897.99
ගෘහභාණ්ඩ සහ සවි කිරීම්වල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		139,615,098.71
මෝටර් වාහනවල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		250,583,167.58
කාර්යාල උපකරණවල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		59,733,262.92
දේපල සහ පිරියතවල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		73,835,541.21
පුහුණු උපකරණවල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන		1,402,662,741.36
ප්‍රගතියේ පවතින ප්‍රාග්ධන වැඩ		
ප්‍රගතියේ පවතින වැඩ - ගොඩනැගිලි ව්‍යුහය	211,008,032.78	
ආයෝජන		
ස්ථාවර තැන්පතු		
ඉන්වෙන්ටරි		
පුහුණු ද්‍රව්‍ය	21,156,683.90	
ලිපි ද්‍රව්‍ය	6,050,791.05	
වෙනත් පරිභෝජන ද්‍රව්‍ය	1,407,073.26	
වෙනත් ලැබීම්		
වැඩසටහන් සඳහා අත්තිකාරම්	60,250.00	
ඉඩම් සඳහා අත්තිකාරම්	18,032,000.00	
ඉදි කිරීම් වැඩවල යෙදවීම් සඳහා අත්තිකාරම්	51,104,293.87	
තැන්පතු	559,750.00	
යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	3,548,334.94	
වාහන සේවා ආදායම් ලැබීම්	142,155.00	
පාඨමාලා ගාස්තු ලැබීම්	17,141,025.00	
වැටුප් ලැබීම්	355,573.67	
ආදායම් හිඟතාවයන්	11,732.00	
රාජ්‍යය සංවිධාන	1,964,635.71	
වෙළඳ සහ වෙනත් ලැබීම්	3,233,673.21	
බොල් ණය සඳහා ප්‍රතිපාදන		5,512,970.65
කාර්ය මණ්ඩල ණය		
ආපදා ණය	46,610,569.22	
උත්සව අත්තිකාරම්	541,250.01	
මුදල් සහ මුදල් සමාන දෑ		

රන් කාසි	104,000.00	
බැංකු ගිණුම්		
අම්පාර	592,048.76	
අනුරාධපුරය	107,992.11	
බදුල්ල	227,266.63	
මඩකලපුව	1,594,023.38	
කොළඹ	132,018.90	
ගාල්ල	769,597.46	
ගම්පහ	33,736.40	
හම්බන්තොට	9,062.14	
ප්‍රධාන කාර්යාලය	48,424,767.57	
යාපනය	472,618.73	
කළුතර	372,224.66	
මහනුවර	257,800.61	
කෑගල්ල	697,663.06	
කිලිනොච්චිය	607,109.33	
කුරුණෑගල	189,901.37	
මාතලේ	506,828.78	
මාතර	97,972.43	
මොණරාගල	544,253.84	
නුවර එළිය	880,327.23	
NVTI - බද්දේගම	336,692.99	
NVTI - මිරිජ්ජවිල	393,277.89	
NVTI - නාරාහේන්පිට	1,150,219.81	
NVTI - නියාගම	609,362.20	
NVTI- ඔරුගොඩවත්ත	109,992.52	
NVTI - රත්මලාන	505,688.40	
NVTI- තලල්ල	234,748.50	
පොළොන්නරුව	90,541.07	
පුත්තලම	462,665.25	
රත්නපුරය	574,962.36	
ත්‍රිකුණාමලය	216,249.72	
වවුනියාව	917,790.37	
අතැති මුදල්	30,120.00	
අතැති චෙක්පත්	123,600.50	
රජයේ ප්‍රධාන ප්‍රාග්ධන		13,472,995.59
රජයේ ප්‍රධාන (භාණ්ඩාගාර) - පුනරාවර්තන		1,311,373,000.00
රජයේ ප්‍රධාන (අමාත්‍යාංශය) - පුනරාවර්තන		124,146,500.00
විලම්භිත ආදායම් ප්‍රදාන - පුනරාවර්තන		391,658,290.56
වෙන් කිරීම් සහ අතිරික්ත		
විලම්භිත ආදායම් ප්‍රධාන		3,612,371,847.75
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		369,317,480.50
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය		2,319,991,544.97
ගෙවීම්		
විගණන ගාස්තු ගෙවීම්		1,493,435.00
පාඨමාලා ගාස්තු ගෙවීම්		801,552.40
තැන්පතු		111,000.00
E.P.F.ගෙවීම්		15,175,420.51
E.T.F. ගෙවීම්		2,276,313.78
දේශක ගාස්තු ගෙවීම්		6,719,687.50
වෙනත් ගෙවීම්		7,668,475.42
ව්‍යාපෘති ආධාර ගෙවීම්		14,114,848.97
අත්තිකාරම් වශයෙන් ලැබීම්		544,575.00

ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		1,621,303.51
රඳවා ගැනීමේ මුදල්		20,474,765.13
වැටුප් ගෙවීම්		1,328,976.79
කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම්		124,050.00
ශිෂ්‍ය රක්ෂණ ගෙවීම්		37,883,500.00
වෙළඳ ණය ගැතියන්		5,186,177.93
W &OP ගෙවීම්		111,871.36
සමුච්චිත වියදම්		
සමුච්චිත වෘත්තීය මාර්ගෝපදේශනය		167,930.00
සමුච්චිත විදුලි බලය		2,704,517.47
සමුච්චිත විභාග සහ ඇගයීම්		343,142.00
සමුච්චිත තෙග් සහ ලිහිස්සුම්		99,000.00
සමුච්චිත සනීපාරක්ෂක සේවා		1,164,190.00
සමුච්චිත නඩත්තු		1,888,912.81
සමුච්චිත පුවත් පත් සහ වාර සඟරා		15,770.00
සමුච්චිත සේවාස්ථ පුහුණුව		153,500.00
සමුච්චිත අතිකාල සහ නිවාඩු දින ගෙවීම්		970,857.54
සමුච්චිත අර්ධකාලීන වියදම්		19,092,252.77
සමුච්චිත ප්‍රවර්ධන වියදම්		350,901.00
සමුච්චිත කුලී, වරිපනම් සහ බදු		299,025.84
සමුච්චිත වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු		1,503,392.24
සමුච්චිත ආරක්ෂණ ගාස්තු		3,261,194.82
සමුච්චිත වැටුප් දීමනා		2,509,000.00
සමුච්චිත දුරකථන ගාස්තු		1,398,632.46
සමුච්චිත ප්‍රවාහනය		34,000.00
සමුච්චිත ගමනාගමනය		663,254.10
සමුච්චිත ජලය		562,117.95
වෙනත් ආදායම්		
වෙන්දේසි ආදායම		1,907,145.18
පාඨමාලා ගාස්තු		1,782,800.00
ආපනශාලා ආදායම		247,625.00
සමාගම් ලියාපදිංචිය		66,500.00
දෛනික කටයුතු		2,000.00
ව්‍යවසායකත්ව වැඩසටහන		134,000.00
දඩ		766,404.86
ශාලා ආදායම		1,224,450.00
නේවාසිකාගාර ගාස්තු		286,500.00
කතරගම සංචාරක බංගලාව		439,230.00
ණය පොළී		1,892,726.47
විවිධ ආදායම්		2,200,308.00
ආපසු නොගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		506,500.00
වාර්තා පොත		5,000.00
ලියාපදිංචි ගාස්තු		34,800.00
නිමැවුම් භාණ්ඩ විකිණුම්		358,352.85
ඉතිරුම් ගිණුම් පොළී		1,661,747.23
සැපයුම් ලියාපදිංචිය		944,500.00
ඉංග්‍රීසි පොත් ආදායම		580,200.00
විභාග ගාස්තු		544,700.00
නිෂ්පාදන ඒකක ආදායම		
ඉපැයුම් 10%		894,310.50
අර්ධකාලීන පාඨමාලා		17,920,717.96
මුද්‍රණ පාසල නාරාහේන්පිට		72,698.93
පෙර ඉගැනුම් හඳුනා ගැනීම.		7,484,909.48

ක්ෂේත්‍ර පරීක්ෂණ		23,444.00
තලල්ල ආපන ශාලාව		96,709.31
වාහන සේවා කිරීම.		62,040.00
වෙනත් නිෂ්පාදන ඒකක		668,171.79
විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර		
උසස් පෙළ සිසුන් සඳහා ආධාර		41,300.00
SSDP සඳහා ආධාර		141,890,720.82
GIZ සඳහා ආධාර		74,260.00
ILO සඳහා ආධාර		2,272,720.17
අමාත්‍යාංශයේ අයවැය යෝජනා සඳහා ආධාර		23,215,188.46
WUSC ව්‍යාපෘතියේ ආධාර		2,703,288.00
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල ආධාර		3,955.00
කාර්ය මණ්ඩල පිරිවැය		
E.P.F.වියදම්	162,033,010.14	
E.T.F. වියදම්	40,511,430.41	
වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම)	341,168,211.00	
වැටුප් සහ අතිකාල	560,248,180.53	
කාර්ය මණ්ඩල පාරිතෝෂිකය	74,985,950.80	
පාරිතෝෂිකය සඳහා අධිභාරය		
ගමනාගමනය		
නවාතැන් වියදම්	473,310.00	
ගමනාගමනය - දේශීය	7,013,762.10	
ගමනාගමනය - විදේශ	7,346,403.20	
භාණ්ඩ සමීක්ෂණ වියදම්	2,020,597.50	
සැපයුම් සහ වෙනත් පරිභෝජන ද්‍රව්‍ය		
ඉන්ධන සහ ලිහිස්සුම් ගෑස්තු	15,619,887.73	
වෙනත් සැපයුම්	2,012,302.04	
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	15,037,198.50	
මුද්‍රිත ද්‍රව්‍ය	6,225,085.49	
නඩත්තුව		
ගොඩනැගිලි නඩත්තුව	11,575,232.28	
දේපල සහ පිරියත නඩත්තුව	6,845,968.13	
වාහන නඩත්තුව	12,525,802.30	
කාර්යාල උපකරණ නඩත්තුව	834,578.21	
ගිවිසුම්ගත සේවා		
වෙළඳ දැන්වීම්	4,318,234.50	
විගණන ගාස්තු	500,000.00	
විදුලිබල ගාස්තු	49,697,300.81	
කුලී අය කිරීම්	3,851,087.32	
රක්ෂණය	3,578,375.74	
සනීපාරක්ෂක සේවා	11,844,076.00	
පුවත්පත් සහ වාර ප්‍රකාශන	491,002.00	
තැපැල් ගාස්තු	1,270,647.10	
කුලී,වරිපනම් සහ බදු	7,576,249.70	
ආරක්ෂක ගාස්තු	38,504,707.03	
කාර්ය මණ්ඩල සුභසාධනය සහ වෙනත්	2,340,367.00	
දුරකථන ගාස්තු	23,730,250.74	
ප්‍රවාහනය	2,950,982.00	
ජල බිල්පත්	10,957,592.04	
උපදෙස් සහ වෘත්තීය ගාස්තු	707,201.93	
රැකියා ගත කිරීම, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය		

විෂයමාලා සංවර්ධනය	504,705.00	
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය	9,107,155.00	
ව්‍යවසායකත්ව වැඩසටහන්	819,189.51	
රැකියාගත කිරීම	712,442.89	
පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන	294,770.00	
පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය	749,018.60	
වෙනත් මෙහෙයුම් වියදම්		
විභාග සහ ඇගයීම්	3,644,629.00	
ප්‍රසාද දීමනා	647,600.00	
නෛතික ගාස්තු	172,250.00	
විවිධ වියදම්	6,058,840.32	
තත්ත්ව කළමනාකරණය සහ ප්‍රතීතනය	2,294,508.07	
වාර ප්‍රවේශ පත්‍ර	5,733,874.03	
විශේෂ පුහුණු වැඩසටහන	335,586.00	
වැටුප් දීමනා	19,341,763.00	
ආවුද සහ පර්යේෂණ ද්‍රව්‍ය	992,384.26	
පුහුණුව අධීක්ෂණය	46,860.00	
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම		
උසස් පෙළ සිසුන් සඳහා වියදම	41,300.00	
SSDP සඳහා වියදම	141,890,720.82	
GIZ සඳහා වියදම	74,260.00	
IlO සඳහා වියදම	2,272,720.17	
අමාත්‍යාංශයේ අයවැය යෝජනා සඳහා ආධාර	23,215,188.46	
WUSC ව්‍යාපෘතිය සඳහා වියදම	2,703,288.00	
ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වියදම	3,955.00	
මූල්‍ය පිරිවැය		
බැංකු අය කිරීම්	163,513.16	
පුහුණු ද්‍රව්‍ය	108,104,905.28	
කාර්ය මණ්ඩල පුහුණුව - ධාරිතා සංවර්ධනය	3,159,306.60	
ප්‍රවර්ධන වියදම්	16,501,720.42	
වෘත්තීය මාර්ගෝපදේශනය	2,263,192.00	
ක්ෂය වීම්	391,658,290.56	
ලාභ /පාඩු ගිණුම්	662,725,978.73	
පෙර වසරේ ගැළපීම්		3,919,933.19
අනුමත හැරයාම් - 2015	3,135,407.60	
අනුමත හැරයාම් - 2016	6,680,226.50	
	11,865,766,207.02	**11,865,766,207.02**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විවිවයි/ඊ/විවිඒ/1/17/17

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 නොවැම්බර් 29 දින

සභාපති

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනතේ 25 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

ප්‍රමිතයේ 41 හා 42 ඡේද අනුව පූර්ව වර්ෂවල සිදු වූ වැරදි මත සිදු කරන ගැලපුම්වල ප්‍රමාණාත්මකභාවය අනුව අතීතානුයෝගීව ගිණුම්වල ගැලපීම් කළ යුතු වුවද ඊට පටහැනි ලෙස අධිකාරිය විසින් 2006-2015 කාලපරිච්ඡේදයට අදාලව ගෙවන ලද රු.67,746,000 ක් වූ සේවක අර්ථසාධක අරමුදලේ දායක ගෙවීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුළ සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කමක් පාවිච්චිය සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද ඊට පටහැනි ලෙස මිලදී ගත් සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර වෙනසක් වේ නම් එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස ගිණුම්වල හෙළිදරව් කළ යුතු විය. එහෙත් අධිකාරිය විසින් එපරිදි අවශ්‍ය ගැලපුම් සිදුකර නොතිබූ අතරම ප්‍රමිතයට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් මගින් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 29 වන ඡේදය අනුව අධිකාරිය විසින් සියළු දේපළ පිරියත හා උපකරණ ගිණුම් තැබීම සඳහා පිරිවැය ක්‍රමය හෝ ප්‍රත්‍යාගණන ක්‍රමය යන ක්‍රම දෙකෙන් එකක් තෝරා ගත යුතු වුවද අධිකාරිය විසින් එම ක්‍රම දෙකම ගිණුම් තැබීමේදී ප්‍රතිපත්ති ලෙස හඳුනාගෙන තිබුණි.

(iv) ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයේ ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනය කිරීමක් අවශ්‍ය වුවද 2008 වර්ෂයෙන් පසුව කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

ප්‍රමිතයේ 20 ඡේදය අනුව සේවා සපයන ආයතනයක් විසින් සිය මෙහෙයුම් ආදායම් හඳුනා ගැනීමේදී අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්ති, ප්‍රමිතයේ සඳහන් ආකාරයට විස්තරාත්මකව හෙළිදරව් කළ යුතු වුවද අධිකාරිය විසින් අර්ධ කාලීන පුහුණු පාඨමාලා ආදායම් හඳුනා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තිය ප්‍රමිතයේ සඳහන් අවශ්‍යතා පරිදි හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

ප්‍රමිතයේ 57 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සේවක පාරිතෝෂික වගකීම පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන ගණනය කර ගිණුම්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීම සඳහා සේවකයා අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන ගණනය කිරීම් සිදුකර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි සිට 2015 මැයි මාසය දක්වා ජීවන වියදම් දීමනාවට අදාළව සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.27,021,229 ක් හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.6,755,307 ක් වූ සේව්‍යායාගේ දායක මුදල් හා එයට අදාලව ගෙවිය යුතු රු.13,539,553 ක් වූ අධිභාර මුදල්ද, සේවක අර්ථසාධක අරමුදලේ සේවක දායකත්වය වූ රු.72,261,572 ක් ඇතුළුව එකතුව රු.119,577,661 ක වියදම් ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සේවා ගිවිසුම් 07 කට අදාලව 2018 වර්ෂය වෙනුවෙන් දරන ලද රු.254,364 ක වියදම් හා 2016 වර්ෂයේ උපචිත වියදම ලෙස හඳුනා ගෙන නොතිබූ එහෙත් 2017 වර්ෂයේදී වැය කරන ලද රු.423,750 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) පොතුවිල් සහ රොක්හිල් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නවීකරණ කටයුතු අවසන් කර එම වියදම් ප්‍රාග්ධනිත කර තිබූ නමුත් එම නවීකරණයට අදාලව තෙකලා විදුලි මනු වෙනත් ස්ථානවලට මාරු කිරීම සඳහා දරන ලද රු.240,470 ක වියදම තවදුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී වැඩ අවසන් කර තිබූ, ගොඩකවෙල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් කාර්මික වැඩහල් ගොඩනැගිල්ලේ වහලය හා කාප්පය (Truss) පිළිසකර කිරීමේ කටයුතු 2016 වර්ෂයේදී අවසන් කර තිබූ නමුත් ඒ වෙනුවෙන් වැයකරන ලද රු.278,887 ක් අදාල වත්කම් ගිණුමට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි.

(ඉ) පනාපිටිය පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා සමරු ඵලකයක් සකස් කිරීම වෙනුවෙන් දරන ලද රු.93,500 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි.

2.2.3 අසම්භාව්‍ය බැරකම්

ආයතනයේ සේවකයෙකු විසින් ආයතනයට විරුද්ධව පවරා තිබූ නඩුවකට අදාලව කම්කරු විනිශ්චය සභාවක් විසින් 2018 අගෝස්තු 23 දින ලබා දී තිබූ තීන්දුවක් මත අදාල නිලධාරියාට රු.3,227,737 ක වන්දියක් ගෙවීමට නියෝග කර තිබුණද ඒ සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද සේවකයන් විසින් ආයතනයට එරෙහිව පවරා තිබුණු නඩු 07 ක් හා ආයතනය විසින් සේවකයෙකුට එරෙහිව පවරා තිබුණු එක් නඩුවක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෘත්තිය පුහුණු හා ග්‍රාමීය අමාත්‍යාංශයෙන් වර්ෂ 17 ක සිට සහ ජාතික ආධුනිකත්ව කාර්මික පුහුණු අධිකාරියෙන් වර්ෂ 14 ක සිට අයකර ගත යුතු පිළිවෙලින් රු. 3,548,335 ක් හා රු.527,436 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) දැනට වසා දමා ඇති ලක්සල ආයතනයෙන් වර්ෂ 12 කට වඩා වැඩිකාලයක සිට රු.1,437,200 ක ශේෂයක් අයකරගත යුතුව තිබුණි.
(අ) හා (ආ) ඡේදවල සඳහන් ලැබිය යුතු ශේෂ අයකරගත නොහැකි නිසා එම ශේෂ කපාහැරීම සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇති බව අධිකාරියේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ 2011 වර්ෂයේ සිට පැවත එන රු. 11,732 ක් වූ ආදායම් හිඟය සමාලෝචිත වර්ෂ අවසානය දක්වා නිරවුල් කරගෙන නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේදී මිලදීගත් ස්ථාවර වත්කම් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.1,875,747 ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයේ පැවති අඩුපාඩුකම් නිසා වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි.

(ඉ) 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිලධාරීන් 10 දෙනෙකුට ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු අරමුදල් දායක මුදල් රු. 111,871 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිරවුල්කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 110	මුදල් රෙගුලාසිය ප්‍රකාරව අලාභ හානි ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවද ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල එබඳු ලේඛන පවත්වා නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 188 (2)	2009 වර්ෂයේ බැංකුවේ තැන්පත් කළ රු.49,644 ක් වූ චෙක්පත් 2 ක් 2017 දෙසැම්බර් 31 වනවිටත් උපලබ්ධි වී නොතිබිය දී ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 272 (3)	එකතුව රු. 4,651,292 ක් වූ ගෙවීම් වවුචර් 13 කට අදාලව මුල් පිටපත් හා අදාල බිල්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(iv) මුදල් රෙගුලාසි 502 (2)	මුදල් රෙගුලාසි ප්‍රකාරව යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. කෙසේ වුවද පරිගණකගත නව ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමේ කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර එහි කටයුතු සියයට 90 ක් 2018 සැප්තැම්බර් 18 දින වන විට අවසන්කර ඇති බව අධිකාරියේ සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(v)	මුදල් රෙගුලාසි 571	කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් 18 දෙනෙකුට වර්ෂ 2 කට වැඩි කාලයක සිට ගෙවිය යුතුව ඇති රු.8,817,754 ක රඳවා ගැනීම් මුදල් හා රු.584,996 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය පරිදි අරමුදලක් පිහිටුවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවද මහා භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව රක්ෂණ අරමුදලක් පිහිටුවා තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ආධුනිකයන්ගෙන් රු. 500 බැගින් එකතු කරන ලද මුදලින් එකතුව රු.37,883,500 ක් අධිකාරියේ බැංකු ගිණුමක තැන්පත්කර වර්ෂය තුළදී රු.507,000 ක රක්ෂණ වන්දි මුදලක් ගෙවා තිබුණි.

(ආ) (i) ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් 2015 සැප්තැම්බර් 04 වන දින මඩකලපුව, වව්නියාව, මන්නාරම, අම්පාර යන දිස්ත්‍රික්වල පාඨමාලා 12 ක් සංවර්ධනය කිරීම සඳහා ආධාර වශයෙන් රු.32,229,600 ක් ලබාදීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ගිවිසුමකට එලඹ තිබුණි. නමුත් විදේශාධාර ලබාදීම සම්බන්ධයෙන් 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 2 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

(ii) තවද එම චක්‍රලේඛයේ 4:4:1 ඡේදය ප්‍රකාරව ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ලබා දී තිබූ විදේශාධාර රේඛීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය මගින් ලබා දී නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.5 ඡේදයට පටහැනිව සහ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධිකාරියේ ක්ෂේත්‍ර රාජකාරීවල යෙදෙන නිලධාරීන්ට පාලක මණ්ඩල අනුමැතිය මත රාත්‍රී නවාතැන් පහසුකම් සඳහා දිනකට මාණ්ඩලික නිලධාරීන්ට රු.2,500 ක් හා අනෙකුත් නිලධාරීන්ට රු.2,000 ක්ද වශයෙන් සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 132,115,206 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.33,280,068 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.165,395,274 ක පිරිහීමක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ පුනරාවර්තන ප්‍රදාන පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.24,900,000 ක් වැඩියෙන් හා පුනරාවර්ථන ප්‍රදාන සඳහා අමාත්‍යාංශයෙන් රු.124,146,500 ක් ලැබී තිබුණද අනෙකුත් ආදායම් රු. 146,925,569 කින් අඩුවීම හා කාර්යමණ්ඩල වියදම රු.149,189,026 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරේ ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2016 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක්ද ඉතිරි වර්ෂවල ඌනතාවයන්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේ ආයතනයේ දායකත්වය රු. 1,023,595,450 ක් වූ අතර 2017 වර්ෂයේදී රු.1,438,489,867 ක් වී තිබුණි. ආයතනයේ දායකත්වය 2016 වර්ෂය දක්වා වැඩිවීමක් පෙන්නුම් කර තිබූ අතර 2017 වර්ෂයේ දී රු.31,818,127 කින් පහත වැටී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

(අ) 2014 – 2018 වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) අධිකාරියට නිපුණතා පාදක උසස් කිරීම්, කාර්ය මණ්ඩල දීමනා ආදිය ඇතුළත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණක් වී තිබුණි. එහෙත් එබඳු සැලැස්මක් 2017 වර්ෂය අවසානය තෙක් සකස් කර නොතිබුණු අතර උපදේශකවරුන්ගේ සුදුසුකම් මට්ටම් පිළිබඳ දත්ත පද්ධතියක් හෝ පවත්වා නොතිබුණි.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් වර්ෂ කිහිපයක සිට ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳ විධිමත් පර්යේෂණ පවත්වා නොතිබුණු අතර ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම සඳහා ද අවධානය යොමුකර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ ක්ෂේත්‍ර 19 කට අදාලව පාඨමාලා 1,544 කට අයත් පූර්ණ කාලීන හා අර්ධ කාලීන පුහුණු වැඩසටහන් 2,663 ක් සඳහා ආධුනිකයින් 37,239 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබූ අතර ක්ෂේත්‍ර 19 හි වැඩසටහන් 2,094 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා ආධුනිකයින් 36,695 ක් බඳවා ගෙන තිබුණි. විස්තර පහත පරිදි වේ.

ක්ෂේත්‍රය	2016		2017	
	ඉලක්ක ගත ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව	සත්‍ය ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව	ඉලක්ක ගත ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව	සත්‍ය ආධුනික බඳවා ගැනීම් සංඛ්‍යාව
▪ තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය	7,890	7,439	8,440	9,360
▪ පුද්ගල හා සමාජ	3,930	4,453	4,875	5,436
▪ රෙදිපිළි හා ඇඟළුම්	4,840	3,842	4,630	4,276
▪ විදුලි විද්‍යුත් හා විදුලි සංදේශ	3,850	3,316	3,790	3,695
▪ ගොඩනැගිලි හා ඉදිකිරීම්	3,630	3,091	3,655	3,692
▪ ඉතිරි ක්ෂේත්‍ර 14	11,320	9,396	11,849	10,236
	35,460	31,537	37,239	36,695

(i) 2017 වර්ෂයේදී 2016 වර්ෂයට සාපේක්ෂව ඉලක්කගත බඳවාගැනීම 1,779 කින් වැඩිකර තිබූ අතර එයින් 1,495 ක්ම වැඩි කර තිබුණේ තොරතුරු තාක්ෂණ (IT) හා පුද්ගල සංවර්ධන (රූපලාවන්‍ය හා කොණ්ඩ මෝස්තර) ක්ෂේත්‍රවල බවත් අනෙකුත් ප්‍රධාන වෘත්තීමය ක්ෂේත්‍රවල නොවන බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අධිකාරිය විසින් ශ්‍රම වෙළඳ පොළ අවශ්‍යතා අනුව පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සිදු නොකරන බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව ආධුනික බඳවා ගැනීම් සියයට 16 කින් හෙවත් 5,158 කින් වර්ධනය වී තිබූ අතර පාඨමාලා හැරයාම් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 04 කින් වර්ධනය වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ තොරතුරු තාක්ෂණ හා පුද්ගල සංවර්ධන පාඨමාලා සඳහා ඉලක්කගත ප්‍රමාණයටත් වඩා ආධුනිකයින් 920 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර සියලු පාඨමාලා, ගාස්තුවලින් නිදහස් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ගාස්තු නිදහස් කිරීම මේ සඳහා හේතු වී තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(iii) සැලසුම් කර තිබූ පූර්ණ කාලීන පාඨමාලාවලට අයත් වැඩසටහන් 354 ක් හා අර්ධ කාලීන පාඨමාලාවලට අයත් වැඩසටහන් 215 ක් උපදේශක හිඟය ඇතුළු හේතූන් මත ක්‍රියාත්මක කර නොතිබුණි. එයින් පිළිවෙලින් වැඩසටහන් 56 ක් හා 52 ක් මෝටර්රථ අළුත්වැඩියා නඩත්තු සහ ගොඩනැගිලි ඉදිකිරීම් යන වෙළඳපොළ වැඩි ඉල්ලුමක් සහිත ක්ෂේත්‍රයන්හි විය.

(iv) ප්‍රවර්ථන වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම්කර තිබූ හෝටල් හා සංචාරක, ලෝහ හා ලුහු ඉංජිනේරු සහ ධීවර හා මත්ස්‍ය වගාව යන අර්ධ කාලීන පාඨමාලා උපදේශකවරුන් ඉදිරිපත් නොවීම, ගෙවීම් ප්‍රමාණවත් නොවීම වැනි ගැටළු නිසා පවත්වා නොතිබුණි.

(v) දැව ආශ්‍රිත නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, මුද්‍රණ හා ඇසුරුම්, ලෝහ හා ලුහු ඉංජිනේරු, සම් ආශ්‍රිත නිෂ්පාදන වැනි වෘත්තීය පුහුණු අංශ සඳහා බඳවා ගැනීම් වැඩි කිරීමට හා සමාජ අවශ්‍යතා පරිදි නව ක්ෂේත්‍ර හඳුන්වාදීම කෙරෙහි අධිකාරියේ අවධානය යොමු වී නොතිබුණි.

(vi) මන්නාරම, මුලතිව් දිස්ත්‍රික් මධ්‍යස්ථාන හා මඩකලපුව, බද්දේගම, මිරිජ්ජවිල ජාතික මධ්‍යස්ථානයන්හි පාඨමාලා සංඛ්‍යාව හා බඳවාගැනීම් සංඛ්‍යාව එම මධ්‍යස්ථානවල ධාරිතාවයට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය වූ අතර එම

දිස්ත්‍රික් හා ජාතික මධ්‍යස්ථානවල පාඨමාලා බඳවා ගැනීම් වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(vii) දිස්ත්‍රික් අනුව වැඩිම පාඨමාලා හැරයාම් ප්‍රමාණය වූ 289 අම්පාර දිස්ත්‍රික්කයෙන් නිරීක්ෂණය වූ අතර එය බඳවා ගැනීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් වී තිබුණි.

(ඇ) **රැකියාගත කිරීම් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) 2017 වර්ෂයේ රැකියාගත කිරීම් අංශයේ (Job Placement) ඉලක්කගත රැකියාගත කිරීම් ප්‍රමාණය 8,300 ක් වූ අතර සත්‍ය රැකියාගත කිරීම් ප්‍රමාණය 6,661 ක් වී තිබුණි.

(ii) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ විදේශීය රැකියාගත කිරීම් ප්‍රමාණය සියයට 28 කින් අඩු වී තිබුණි. විදේශීය රැකියාගත කිරීම් වැඩි කිරීම සඳහා විදේශ රැකියා වෙළඳපල පදනම් කරගත් විධිමත් වැඩපිළිවලක් අධිකාරිය සතුව නොපවතින අතර සමස්ත රැකියාගත කිරීම් වලින් විදේශීය රැකියාගත කිරීම් සියයට 02 ක් වැනි ඉතා අවම මට්ටමක පැවතුණි.

(iii) පෙර වර්ෂයට සාපේක්ෂව දේශීය රැකියාගත කිරීම් සියයට 06 කින් වර්ධනය වී තිබුණද ඉලක්කගත සංඛ්‍යාව හා සැසඳීමේදී සියයට 23 කින් අඩු වී තිබුණි.

(iv) ක්ෂේත්‍ර අනුව රැකියාගත කිරීම් ප්‍රමුඛතා අනුපිළිවෙලෙහි ඉහළම ස්ථානය විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රයට හිමි වී තිබූ අතර එම ප්‍රමාණය 971 ක් වී තිබුණි. තවද සමස්ත රැකියාගත කිරීම්වල ප්‍රතිශතයක් ලෙස එය සියයට 15 ක ප්‍රමාණයකි. නමුත් මැණික් හා ස්වර්ණාභරණ, මුද්‍රණ හා ඇසුරුම්, ධීවර හා මත්ස්‍ය වගාව, සම් ආශ්‍රිත නිෂ්පාදන වැනි ක්ෂේත්‍රයන්හි රැකියාගත කිරීම් සමස්ත රැකියාගත කිරීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට එකකටත් වඩා අඩු මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය. එම ක්ෂේත්‍රවලට අදාල පාඨමාලා කාලීන අවශ්‍යතා අනුව සකස්කර ඉදිරිපත්කර නොතිබුණි.

(v) අධිකාරියෙන් පුහුණුව ලබා ඉවත්වන පුහුණුලාභීන් රැකියාගත කිරීම සම්බන්ධව පසුවිපරම් කර නොතිබූ අතර ඒ පිළිබඳ දත්ත පද්ධතියක් අධිකාරිය සතුව නොමැති වීමෙන් රැකියාගත කිරීම් පිළිබඳ සංඛ්‍යාවල නිවැරදිතාවය විගණනයේදී තහවුරුකරගත නොහැකි විය.

(ඇ) **පර්යේෂණ හා සංවර්ධන අංශයේ කටයුතු පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(i) අධිකාරියේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් පර්යේෂණ හා අධ්‍යයනයන් 04 ක් සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 1.5 ක් වර්ෂය සඳහා වෙන් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ එක් අධ්‍යයනයක් පමණක් අවසන් කර තිබුණි.

(ii) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වූ "වෘත්තීය පුහුණුව ලැබූවන් පිළිබඳ ඡායා අධ්‍යයනය - කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක 2014/2015" යන පර්යේෂණය 2017 වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(iii) අධිකාරියේ උපදේශකවරුන් සේවය හැරයාමට හේතු වන කරුණු සොයා බැලීමේ අධ්‍යයනය හා අධිකාරියේ පුහුණුව අවසන් කරන පුහුණුලාභීන් අවසාන ඇගයීම් සඳහා සහභාගීත්වය අඩුවීමට හේතු හඳුනා ගැනීම සහ සහතික පත්‍ර ලබා ගැනීමේ ප්‍රවණතාවය අවම්වීමට හේතු හඳුනා ගැනීම සඳහා වූ පර්යේෂණ අධ්‍යයන 2017 වර්ෂය තුල අවසන් කිරීමට නියමිත වුවද එම කටයුතු මූලික අධියරයෙහි පැවතුණි.

(iv) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ශක්‍යතා අධ්‍යයන 05 ක් සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. වෘත්තිය පුහුණු ක්ෂේත්‍රයේ කාලීන අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට අදාලව පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීම පර්යේෂණ අංශයේ ප්‍රධාන අරමුණ වුවද ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඉ) අනෙකුත් දිස්ත්‍රික්කවල ඉඩම් පුනරුත්ථාපනය සඳහා රු.මිලියන එකක් වෙන්කර තිබූ අතර එයින් හිඟුරක්ගොඩ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, නාරාහේන්පිට ජාතික මධ්‍යස්ථානය හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ ඉඩම් පුනරුත්ථාපනය සිදුකර තිබූ අතර ඒ සඳහා රු. 2,098,601 ක් වැය කර තිබූ අතර වෙන්කර තිබූ මුදල් ප්‍රමාණය ඉක්මවා රු.1,098,601 ක් වැයකර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුල ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මධ්‍යස්ථානයේ ආරක්ෂක සේවා සිදු කිරීමට යොදවා තිබූ ආරක්ෂක නිලධාරීන් අඛණ්ඩව දින 5 සිට 28 ක පරාසයක සේවයේ යෙදී තිබූ බව නිරීක්ෂණය වූ අතර එලෙස සේවයේ යෙදී සිටීමෙන් ආරක්ෂක සේවය අපේක්ෂිත පරිදි එම නිලධාරියාගෙන් ඉටු නොවන බව සහ දින දෙකකට වඩා එක දිගට සේවය ලබාගැනීම කම්කරු ආඥා පනතේ නීතිරීතිවලට පටහැනි බව නිරීක්ෂණය විය.

(ආ) 2017 පෙබරවාරි 20 දින මෝටර් රථ අනතුරකින් තුන්වන පාර්ශවයන්ට සිදුව තිබූ අලාභ වෙනුවෙන් රු.322,232 ක් අධිකාරියේ අරමුදලින් ගෙවා තිබූ අතර ඊට අදාල රක්ෂණ ආයතනයෙන් මුදල් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට 2015 මැයි දක්වා කාලසීමාවට අදාලව ජීවන වියදම මත සේවක භාරකාර අරමුදලට අධිකාරියේ සේවයේ නියුතු සේවකයන් වෙනුවෙන් සියයට 03 ක් වූ රු.27,098,089 ක දායක මුදල් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය විසින් 2017 ජූලි 07 දින රු.13,549,044 ක අධිභාරයක් පනවා තිබුණු අතර 2016 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතු බව දන්වා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් අධිභාර මුදල අයකර ගැනීමට කටයුතු කරන ආකාරය පිළිබඳව දන්වන ලෙස නියෝග කර තිබුණි. නමුත් අධිකාරිය විසින් අදාල නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ට එරෙහි විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකර නොතිබූ අතර අධිභාර මුදල් ගෙවීමට අවශ්‍ය අයවැය ප්‍රතිපාදන අධිකාරියට නොතිබියදී මුදල් අංශය විසින් ඉදිරිපත්කර තිබූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 02 මගින් මෙම මුදල වාරික 12 කින් ගෙවා නිම කිරීමට 2018 ජූලි 24 දින පාලක සභා අනුමැතියට ඉදිරිපත්කර තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ උපසභාපතිවරයා සඳහා පෞද්ගලික ආයතනයකින් කුලී පදනම මත 2017 ඔක්තෝම්බර් 27 දින සිට 2017 නොවැම්බර් 27 දින දක්වා ලබාගෙන තිබූ මෝටර්රථයක් සඳහා ධාවන සටහන් පත්‍රයේ සඳහන් ධාවන දුර ප්‍රමාණය ඉක්මවා කිලෝමීටර් 601 ක් සඳහා ගෙවීම් සිදුකිරීමෙන් රු.21,035 ක් වැඩියෙන් ගෙවා තිබුණු අතර මෙම මෝටර් රථය 2017 නොවැම්බර් මාසයේදී ධාවන සටහන් පත්‍ර අනුව ධාවනය කර නොතිබියදී ඉන්ධන ලීටර් 780 ක් සඳහා රු.74,500 ක් ගෙවා තිබුණි.

(ආ) අධිකාරියේ සභාපතිවරයා වෙත මෝටර් රථයක් වෙන්කර තිබියදී මාසිකව රු. 90,000 ක කුලී ගාස්තුවක් ගෙවීමේ පදනම මත මෝටර් රථයක් ලබාගෙන තිබුණි. අධිකාරිය මගින් සභාපති වෙත වෙන් කරන ලද වාහනය සඳහා අනුමත ඉන්ධන සීමාව ඉක්මවා ඉන්ධන සැපයීම වෙනුවෙන් රු.54,267 ක් වැය කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයෙන් පසු ඉවත් කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ගලපා නොතිබූ අතර ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලැයිස්තුව අනුව 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 8,576 ක් වූ වර්ග 09 කට අයත් ස්ථාවර වත්කම් අයිතම 185948 ක් අධිකාරිය සතුව පැවැති නමුත් එකිනෙක වත්කම් භෞතිකව හඳුනා ගැනීම සඳහා අංකන ක්‍රමයක් (Code System) භාවිතාකර නොතිබුණි. මේ නිසා ලේඛනයේ පවත්නා වත්කම්වල භෞතික පැවැත්ම නිශ්චය කර ගැනීමට නොහැකි විය.

(ඈ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදුන් රු. 10,427,342 ක් එම අරමුණු සඳහා යොදා නොගෙන මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි.

4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු. 1,500,000 ක් වූ සහ 2017 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.112,627 ක් වූ ලංකා අශෝක් ලේලන්ඩ් බස්රථය වර්ෂ දෙකකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේද, පිරිවැය රු.1,100,000 ක් වූ සහ

2017 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 82,593 ක් වූ ලංකා අශෝක් ලේලන්ඩ් බස්රථය වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අම්පාර නින්දවූර් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) ගාල්ල දිස්ත්‍රික් කොග්ගල වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ බර වාහන පුහුණු පාඨමාලාවට අයදුම්කරුවන් ඉල්ලුම්කර නොමැති වීම නිසා පුහුණු කටයුතු ආරම්භකර නොතිබූ අතර 2016 වර්ෂයේදී පුහුණු කටයුතු සඳහා අනුයුක්ත කර තිබූ බස් රථය වසරකට වැඩි කාලයක සිට නිශ්කාර්යව පුහුණු මධ්‍යස්ථාන භූමියේ ගාල්කර තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර දැරූ නිලධාරියා 2015 මැයි 05 දින සිට අධ්‍යක්ෂ මුදල් තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර එම නිලධාරියා 2018 සැප්තැම්බර් 03 දින සිට එම තනතුරේ ස්ථිරකර තිබූ නමුත් 2015 මැයි මාසයේ සිට අධිකාරියේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා ස්වාධීන සුදුසුකම්ලත් ස්ථිර නිලධාරියෙකු පත්කිරීම සඳහා අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 2,371 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1,876 ක් වූයෙන් පුරප්පාඩු 557 ක් වී තිබුණි. පුරප්පාඩුවලින් 441 ක් උපදේශකවරුන් වීම නිසා ඉලක්ක කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පැවැත්වීමට නොහැකි වී තිබුණි. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීමේදී නිලධාරීන්ට පෞද්ගලික වන සේ ද්විතියික හා ප්‍රාථමික මට්ටම්වල තනතුරු 149 ක් ලබා දී තිබූ අතර දැනට එයින් තථ්‍ය තනතුරු සංඛ්‍යාව 98 ක් විය.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි, ආයතනවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුකරගැනීම සඳහා උක්ත චක්‍රලේඛයේ 07 ඡේදයේ සඳහන් පරිදි විගණන වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආයතනය සතුව නිළධාරීන් 12 දෙනෙකුගෙන් සැදුම්ලත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද විගණන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කටයුතුවල පැවති අඩුපාඩු සහ පූර්ව විගණන කටයුතුවල යෙදීම වැනි කටයුතු හේතුවෙන් එම ඒකකය පවත්වාගෙන යාමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 6.3.3 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ වගකීම ප්‍රසම්පාදන කමිටුව වෙත පැවරී තිබුණද අවස්ථා 06 කදී ලංසු විවෘත කිරීමේ කමිටුවේ සාමාජිකයන් පත්කිරීම අධිකාරියේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) විසින් සිදුකර තිබුණු බව විගණන නියැදි පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) ඡේදය ප්‍රකාරව වැල්ලවායවත්ත පුහුණු මධ්‍යස්ථානය නවීකරණ කිරීමේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාලය 2017 ජුනි 10 දිනෙන් අවසන් වී තිබුණද අදාල වැඩ නිම කර නොතිබුණු අතර කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 ඡේදය අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සඳහා විෂය සම්බන්ධ දැනුම ඇති පුද්ගලයෙකු පත්කළ යුතු වුවද වැල්ලවායවත්ත දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන කමිටුවට විෂයගත ඉදිකිරීම් කටයුතු පිළිබඳ දැනුමැති නිලධාරියෙකු ඇතුළත්ව නොතිබුණි.

(ඈ) නාරාහේන්පිට ජාතික ෘත්තීය පුහුණු ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් තරහකාරී මිලගණන් කැඳවා ආපනශාලාව බාහිර පාර්ශවයකට බදු පදනමට ලබාදෙන ලෙස 2017 ජනවාරි 23 වන දින අධිකාරියේ අධ්‍යක්ෂ (පාලන) වෙත දන්වා තිබූ නමුත් මේ සඳහා වූ තාක්ෂණ ඇගයීම් කමිටුව පත් කිරීම් කටයුතු මාස 07 ක් ප්‍රමාද වී තිබුණි.

(ඉ) ලංසු කැඳවීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ සහිතව සැපයුම්කරුවෙකු නම් කර 2017 නොවැම්බර් 20 දින ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ නමුත් 2018 අගෝස්තු 31 දින වන විටත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී නොතිබූ අතර තීරණ ලබාදීම ප්‍රමාද කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. මේ නිසා විගණන දිනය වූ 2018 අගෝස්තු 31 දින දක්වාම නව සැපයුම්කරුවෙකු තෝරාගෙන නොතිබූ අතර පෙර සැපයුම්කරු විසින්ම ආපනශාලාව පවත්වාගෙන යමින් පැවතුණි.

(ඊ) 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2018 අගෝස්තු 31 දක්වාම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක්ද නොමැතිව ආපනශාලාව පවත්වාගෙන යන ආපනශාලා බදුකරු විසින් 2017 දෙසැම්බර් 05 දින අධිකාරියේ උපසභාපති වෙත ඉදිරිපත් කළ ලිපියකට අනුව ඔහු වැඩිම කුලී මුදලක් ඉදිරිපත්කර ඇති බවත් ආපනශාලාව පවත්වාගෙන යාමේ අවස්ථාව ඔහුට හිමිනොවුන බැවින් සාධාරණයක් ඉටුකරන මෙන් ඉල්ලා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ රහස්‍යභාවය ආරක්ෂා කරගත යුතු වුවත් ප්‍රසම්පාදන තීරණ ලබාදීමට ප්‍රථම ලංසු ප්‍රදානය පිළිබඳ බාහිර පාර්ශවයන් වෙත තොරතුරු හෙළිදරව් කර තිබීමෙන් සම්බන්ධිත පාර්ශවයන් විසින් එම ක්‍රියාවලියේ රහස්‍යභාවය ආරක්ෂා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැල්ලවායවත්ත පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා 2016 අගෝස්තු 19 දින ගිවිසුමකට එළඹ තිබූ අතර 2017 ජුනි 10 දිනට ඉදිකිරීම් නිම කල යුතු විය. එසේ වුවද දින 124 ක ප්‍රමාදයකින් පසුව 2017 ඔක්තෝම්බර් 11 දිනදී ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට යටත්ව අධිකාරිය විසින් ගොඩනැගිල්ල භාරගෙන තිබූ අතර ප්‍රමාද දින සඳහා සම්පූර්ණ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

(ආ) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා රු. 42,613,557 ක ගිවිසුම්ගත වටිනාකමක් සහිතව වැඩහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ 2013 ඔක්තෝබර් 07 දින ගිවිසුමකට එළඹ තිබූ අතර එම ගිවිසුම ප්‍රකාරව එහි වැඩ 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වුවද එදිනට කළ වැඩවල වටිනාකම රු. 19,353,158 ක් වූයෙන් වැඩ අවසන් කර භාර නොදීම මත 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් කාර්යය අත්හිටුවා තිබුණි. එම තීරණයට එකඟ නොවූ පෞද්ගලික සමාගම සමථකරණ මණ්ඩලයක් වෙත මෙම සිද්ධිය යොමු කර තිබුණි. අධිකාරිය විසින් උපදේශන ආයතනයක උපදෙස් මත 2015 ඔක්තෝබර් 25 දින සකස් කරන ලද අවසන් බිල්පත අනුව කොන්ත්‍රාත් සමාගමෙන් රු.3,819,000 ක මුදලක් ආපසු අයකර ගත යුතුව තිබුණි. ඉදිකිරීම් කාර්යය වෙනත් කොන්ත්‍රාත් ආයතනයක් ලවා නිම කිරීම සඳහා 2016 අප්‍රේල් 08 දින නැවත ලංසු කැඳවා තිබුණද ඉදිකිරීම් කළ මුල් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹ නොතිබීම හේතුවෙන් දෙවන වරට කැඳවූ ලංසු ඇගයීම් කටයුතු අත්හිටුවීමට 2016 ඔක්තෝබර් 27 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. කෙසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් වැඩ වසර තුනකට වැඩි කාලයක සිට අත්හිටුවා තිබුණි.

(ඇ) i නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාතලේ කයිකාවල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා දින 180 කින් ඉදිකිරීම් වැඩ නිම කිරීමට 2017 අප්‍රේල් 25 දින රු.17,679,003 කට ගිවිසුමකට එළඹ තිබුණි. නවීකරණ කටයුතු සිදුකිරීමේදී යකඩ කාප්ප සවිකර තිබූ කොන්ක්‍රීට් කොටස අපරීක්ෂාකාරී ලෙස ඉවත්කර ඇති බවත් පළපුරුදු අධීක්ෂණ නිළධාරියෙකුගේ අධීක්ෂණය නොමැති වීම හේතුවෙන් පැරණි ගොඩනැගිල්ලට හානි සිදු වී ඇති බවත් 2017 ජුනි 08 දින අධිකාරියේ ඉදිකිරීම් අංශයේ අධ්‍යක්ෂ සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය කර තිබුණි.

මූලික ඇස්තමේන්තු සැකසීමේදී ගොඩනැගිල්ලේ පැවති ගඩොල් කුළුණු මත කොන්ක්‍රීට් තලාදයක් ඉදිකොට ඒ මත යකඩ කාප්ප සවිකිරීමට සැලසුම් කොට තිබුණද, වහලය ඉවත්කිරීමේදී කුළුණු වලට හානි වීම නිසා නව කොන්ක්‍රීට් කුළුණු ඉදිකිරීමට සිදුව ඇති බව දන්වා තිබුණි. ඒ අනුව රු.1,170,000 ක අළුත් කොන්ක්‍රීට් කණු ඉදිකිරීම වෙනුවෙන් රු.1,707,900 ක සියයට 10 ක් වූ අවිනිශ්චිත මුදල් සීමාව තුල දැරීමට සභාපතිගේ අනුමැතිය ලබාගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. කෙසේ වුවද නොසැලකිලිමත්ව කාර්යය ඉටුකල නිලධාරීන් නිශ්චය කර මෙම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ii. අයහපත් කාලගුණික තත්ත්වයත්, නාදුනන ගම්වාසීන්ගේ තර්ජන නිසා ශ්‍රමිකයන් සේවයට අකමැතිවීම හා අතිරේක වැඩ සඳහා අමතර මුදලක් නොගෙවීම හා වහලය වෙනස් කිරීම සඳහා තොරතුරු ලැබීම ප්‍රමාද වීම හා ගෙවීම් ප්‍රමාදය යන හේතූන් මත ඉහත කොන්ත්‍රාත්තුවේ කාලය 2018 අප්‍රේල් 10 දක්වා කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා විධිමත් පරිදි උපදේශක සේවා ලබා නොදීම, සැලසුම සැකසීමේදී මායිම් නිසි ලෙස හඳුනා නොගැනීම සැලසුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

iii. 2018 ජනවාරි 31 දිනෙන් ඉදිකිරීම් කාලය අවසන්වීමට නියමිතව තිබුණද ව්‍යාපෘතිය ආරම්භයේ සිටම ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමබලකායක් නොයෙදීම හා අවශ්‍ය අමුද්‍රව්‍ය නිසි වේලාවට වැඩබිමට නොසැපයීම පිළිබඳ උපදේශක ආයතනය හා අධිකාරිය මඟින් වරින්වර කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබූ නමුත් සිදුකර ඇති ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය සියයට 60 ක් පමණ වූ බව ප්‍රගති වාර්තාවල දක්වා තිබූ අතර 2018 ජූලි 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) i. අහංගම හෝටල් පාසල නවීකරණය සඳහා රු.110,355,000 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට 2014 ඔක්තෝබර් 24 දින එළඹ තිබූ අතර දින 240 කින් නවීකරණ කටයුතු අවසන් කළ යුතු විය. එහෙත් 2017 දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර හාරදී නොතිබුණි. එය පිහිණුම් තටාකයක්, සුඛෝපභෝගී කාමර ලෙස නවීකරණය කළ කාමර 13 ක් සහිත අංග සම්පූර්ණ හෝටලයක් ලෙස වරින්වර සැලසුම් වෙනස් කරමින් නවීකරණය කර තිබුණි.

ii. මූලික නවීකරණ සැලැස්මට ඇතුළත් නොවූ මුළුතැන්ගෙය නවීකරණ කටයුතු පසුව සිදුකිරීමට තීරණය කර එම කටයුතු 2017 දෙසැම්බර් 23 දින රු. 4,920,314 ක වටිනාකමකට වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණු අතර 2018 ජනවාරි 12 දින අවසන් කිරීමට නියමිත විය. අධිකාරිය මඟින් අවශ්‍ය සැලසුම් හා උපදෙස් ලබානොදීම නිසා ඉදිකිරීම් ප්‍රමාදවීමට හේතුවී තිබුණු අතර 2018 ජුනි 05 දක්වා නැවත කාලය දීර්ඝ කර තිබුණි.

iii. නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති ආධාර මත කොන්ත්‍රාත් වටිනාකම රු.162,707,530 ක් වූ හොටල් පාසලක්, ආසන්න වෙනත් ස්ථානයක ඉදිකිරීම 2017 පෙබරවාරි 02 දින ආරම්භකර තිබූ අතර ගිවිසුම අනුව 2018 අගෝස්තු 01 දිනට එහි ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු වුවත් එහි ඉදිකිරීම් කටයුතුද අවසන්ව නොතිබුණි. තවද ඒ හේතුවෙන් 2014 වර්ෂයේදී නවතා දමන ලද පාඨමාලා හතර 2018 වර්ෂය වන විටත් ආරම්භ කිරීමට නොහැකිවීමෙන් අරමුදල් සපයා දී තිබූ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ හා අධිකාරියේ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඉ) හෝටල් පාසලේ පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම්කර නොතිබියදී බෙකරි, භෝජනාගාර සේවක, කාමර සේවක හා අරක්කැමි යන පාඨමාලා සඳහා අවශ්‍ය රු. රු.10,931,904 ක් වූ පුහුණු උපකරණ 2015 හා 2016 වර්ෂවලදී අධිකාරිය විසින් මිලදී ගෙන ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දී තිබුණි. මෙම භාණ්ඩ ගබඩා කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලයේ ඉඩ පහසුකම් නොමැති නිසා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 3 ක හා නවීකරණ කටයුතු සිදු කරන ආදර්ශ හෝටල් පාසල තුල භාවිතයකින් තොරව අනාරක්ෂිතව, අක්‍රමවත් ලෙස හා නිෂ්කාර්යව තබා තිබූ බව 2018 මැයි 05 දින කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. සමහර භාණ්ඩවල වගකීම් කාලය ඉක්මවා තිබූ අතර ඇඳ ඇතිරිලි, තුවා වැනි භාණ්ඩ ආරක්ෂිතව ගබඩා නොකිරීම නිසා විනාශයට පත් වී තිබුණි. තවද මෙම භාණ්ඩ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි පොත්වල ඇතුළත් කර නොතිබූ අතර 2015,2016 හා 2017 වර්ෂවලදී අදාල භාණ්ඩ පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් සමීක්ෂණයන් සිදුකර වාර්තා කර නොතිබුණි.

(ඊ) 2017 වර්ෂය තුළ මිලදී ගත් රු.6,767,868 ක් වූ හෝටල් උපකරණ තොගයක් හා රු. 6,758,049 ක් වටිනා ගෘහ භාණ්ඩ අහංගම හෝටලය වෙත ලබා දී තිබුණද නවීකරණ කටයුතු අවසන් නොවීම හා හෝටලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම අධිකාරිය සතුව නොමැතිවීම හේතුවෙන් එම භාණ්ඩ හා උපකරණ නිශ්කාර්යව පැවතුණි. හෝටලය ඉදිකරන ලද ඉඩම දකුණු පළාත් සංචාරක කාර්යාංශයට අයත් වූ අතර ගිවිසුම අනුව ඉඩම පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා පමණක් ලබාදී තිබුණු බැවින් හෝටලයක් ලෙස පැවැත්වීමේ හැකියාව පිළිබඳ විගණනයේදී ගැටළුකාරී විය.

6.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය වියදම් දැරීමෙන් පසු 2018 වර්ෂයේදී සංශෝධනය කර තිබූ අතර ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය 2018 පෙබරවාරි 27 දින ලබාගෙන තිබුණි. ඒ අනුව වියදම් දැරීමේදී අයවැය ලේඛනය කාලීනව සමාලෝචනය කර අදාල සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබූ බවත් ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම්වල සියයට 14 සිට සියයට 100 දක්වා විචලනාවන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය කළමනාකරණ මූල්‍ය පාලන උපක්‍රමයක් ලෙස භාවිතා කර නොතිබුණි.

6.4 නොවිසඳී ඇති විගණන ඡේද

මාගේ පසුගිය වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත ඌනතාවයන් සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(අ) අධිකාරියට අයත් කැබ් රථයක් 2003 වර්ෂයේදී අනතුරට ලක්වී තිබූ අතර එම අනතුර සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කමිටුවක් පත්කර තිබුණේ වර්ෂ 06 කට පසුව 2009 පෙබරවාරි මාසයේදීය. එම පරීක්ෂණ කමිටු වාර්තාවට අනුව අනතුරෙන් වූ රු. 421,000 ක අලාභයෙන් රු. 185,333 ක් රියදුරුගෙන් ඉතිරි රු. 235,667 තවත් නිලධාරීන් 04 දෙනෙකුගෙන් හා රු. 135,000 ක් වටිනා අමතර කොටස් නැතිවීම සම්බන්ධයෙන් වාහන

භාරව සිටි නිලධාරීන්ගෙන්ද අයකර ගන්නා ලෙසට නිර්දේශ කර තිබුණද එම නිර්දේශ 2017 ඔක්තෝබර් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. 2015 වර්ෂය දක්වාම වාහනයේ අනතුර පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර දැනට එම වාහනය අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ලෝක සංචාරක දිනය සැමරීම වෙනුවෙන් සැලසිනේ ආයතනයට ගෙවීම සඳහා 2012 පෙබරවාරි මාසයේ දී රු.7,500,000 ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ආයතනයෙන් ලැබී තිබුණි. අදාළ ගෙවීම් කිරීමෙන් අනතුරුව ඉන් ඉතිරි වූ රු.1,000,000 ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව 2015 වර්ෂයේ දී අධිකාරියේ ආදායමට ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් 2015 සහ 2016 වර්ෂය තුලදී අවස්ථා 2 කදී ටොනර් 09 ක් මිලදී ගැනීම වෙනුවෙන් 101,650 ක් ව්‍යාජ ඉන්වොයිසි පදනම් කරගෙන ගෙවා තිබූ අතර අදාල භාණ්ඩ ගබඩාව වෙත ලැබී නොතිබියදී කළමනාකරණය විසින් ලබා දෙන ලද උපදෙස් අනුව තොග පොත්වල භාණ්ඩ ලැබීම් ලෙස ඇතුළත් කර තිබුණි. අදාල ගෙවීම් වවුචර වල සඳහන් නොවන වෙනත් පුද්ගලයෙකුගේ නමකට ගෙවීම් සඳහා වූ චෙක්පත් නිකුත්කර තිබුණි. තවද මිලදී ගැනීම් හා චෙක්පත් සම්බන්ධ කටයුතු කරන නිලධාරිනියට හා චෙක්පත් නිකුත් කරන ලද පුද්ගලයාගේ බද්ධ ගිණුමකට එම මුදල් සාවද්‍ය ලෙස බැර කරගෙන තිබූ බව නිරීක්ෂණය විය. අධිකාරිය විසින් අදාල නිලධාරීන් සම්බන්ධ මූලික පරීක්ෂණයක් පවත්වා අවසන්කර තිබුණත් 2018 ජූලි 31 දින වන විටත් අවසාන පරීක්ෂණයේ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි.

(ඈ) මූල්‍ය අක්‍රමිකතා මත 2011 වර්ෂයේ වැඩ තහනම් කර නඩු පවරා තිබූ නිලධාරියෙකුට අනුමැතියකින් තොරව 2011 සිට 2013 කාලය දක්වා වැටුප් වශයෙන් රු. 1,711,961 ක් ගෙවා තිබූ අතර මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂය වන තෙක්ම කටයුතු කර නොතිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	කාර්ය මණ්ඩල පරිපාලනය	- බඳවා ගැනීමේ අවම සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බඳවා ගෙන තිබීම. - පුරප්පාඩු තනතුර සඳහා ස්ථීර නිලධාරීන් බඳවා නොගැනීම හා වැඩ බැලීමේ පදනම මත දීර්ඝ කාලීනව නිලධාරීන් යෙදවීම.
(ආ)	වත්කම් කළමනාකරණය	- විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නොපැවැත්වීම. - වත්කම් හඳුනා ගැනීමේ කේත භාවිතා නොකිරීම - නිෂ්කාර්ය වත්කම් පැවතීම - සියළු වත්කම් ඉන්වෙන්ට්‍රිගතව පැවතීම තහවුරු නොවීම හා වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම.
(ඇ)	මූල්‍ය පාලනය	- කාර්යභාරයන් බෙදීම හා ඒවා අභ්‍යන්තර පරීක්ෂා වන පරිදි ක්‍රියාත්මක නොවීම. - අධීක්ෂණ කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම
(ඈ)	ගිණුම්කරණය	- විධිමත් අනුමැතියකින් තොරව ජ'නල් සටහන් වෙනස් කිරීම.

(ඉ)	කොන්ත්‍රාත් පරිපාලනය	-	කාර්යසාධන සුරක්ෂණ කල් ඉකුත්වීමට පෙර දින දීර්ඝ නොකිරීම.
		-	ගොඩනැගිලි ඉදිකරන ඉඩම්වල නිශ්චිත මායිම් දැක්වීම ඇතුලු පහසුකම් හා උපදෙස් කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම.
		-	කොන්ත්‍රාත් කටයුතු අධීක්ෂණය නොකිරීම.
(ඊ)	කාර්ය සාධනය	-	කාර්ය සාධනය ඉලක්ක, සැසඳීම හා වෙනස්කම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2.2.1. (අ) මේ වන විට සියළු ගෙවීම් සිදු කර අවසන් වී ඇත.
2.2.1. (ආ)(i) නිවැරදි කර ඇත.
2.2.1. (ආ)(ii) 2018 වර්ෂයේදී නිවැරදි කරඅ ඇත.
2.2.1. (ආ)(iii) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.2.1. (ආ)(iv) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.2.1. (ඇ) ඒ අනුව කටයුතු කර ඇත.
2.2.1. (ඇ) ඒ අනුව කටයුතු කර ඇත.
2.2.2. (අ) ඒ අනුව කටයුතු කර ඇත.
2.2.2. (ආ) ඒ අනුව නිවැරදි වනු ඇත
2.2.2. (ඇ) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.2.2. (ඈ) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.2.2. (ඉ) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.2.3. අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු

නඩු අංකය	නඩුව පවරා ඇති පාර්ශවය සහ කාරණය	වර්තමාන තත්වය
SCFR 161 /2014	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවයේ නියුතු උපදේශකවරුන් 4 දෙනෙකු පුහුණු නිළධාරි තනතුරට උසස් නොකිරීම සම්බන්ධව පවරා ඇති නඩුව	සමථය සඳහා යොමු කර ඇත.2018.11.08 දිනැති නියෝගය ප්‍රකාරව පෙත්සම්කරුවන් විසින් නඩුව ඉල්ලා අස්කර ගන්නා ලදි. ගොනුව වසා දැමීමට කටයුතු කල හැකිය.
SCFR /309/2014	ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවයේ නියුතු සහකාර අධ්‍යක්ෂ තනතුරේ වැඩ ආවරණය කරනු ලබන පුහුණු නිළධාරින් 11 දෙනෙකු විසින් සහකාර අධ්‍යක්ෂ තනතුරට උසස් නොකිරීම සම්බන්ධව පවරා ඇති නඩුව	වැඩිදුර විභාගය 2020/03/23 දිනට නියමිතය.
2/AD/3668/2013	අධිකාරියේ සේවයේ යෙදී සිට මූල්‍ය වංචාවක් සම්බන්ධව සේවයෙන් පහ කරනු ලැබූ හිටපු අධ්‍යක්ෂ මුදල් එස්.ඒ.ඩී.ජේ. චන්ද්‍රකුමාර මහතා විසින් තමා සේවයෙන් පහ කිරීමට එරෙහිව පවරා ඇති නඩුව	නඩුව අවසන්.නියෝගයට එරෙහිව අප අධිකාරිය විසින් අභියාචනා ගොනු කර ඇත
9/NE/24/2017	අධිකාරියේ සේවයේ යෙදී සිට ව්‍යාජ සහතිකපත් ඉදිරිපත් කිරීම සම්බන්ධව සේවයෙන් පහ කරනු ලැබූ එම්. රාමචන්ද්‍රන් මහතා විසින් තමා සේවයෙන් පහ කිරීමට එරෙහිව පවරා ඇති නඩුව	2020.01.21 දින වැඩිදුර විභාග සඳහා නියමිතය
CA/Writ/307/2018	වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන වනරාජ ඉඩමේ හිමිකම සම්බන්ධව බොගවන්තලාව වතු සමාගම විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට එරෙහිව පවරා ඇති නඩුව	විභාගය සඳහා නියමිතය. 2020/03/04

අධිකාරිය විසින් පවරා ඇති නඩු

නඩු අංකය	නඩුව පවරා ඇති පාර්ශවය සහ කාරණය	වර්තමාන තත්වය
DMR/ 1029/2014	මූල්‍ය වංචාවක් හේතුවෙන් වැඩ තහනම් කළ හිටපු අධ්‍යක්ෂ මුදල් වෙත ගෙවන ලද වැටුප නැවත අයකර ගැනීම සඳහා පවරා ඇති නඩුව	විභාගය සඳහා නියමිතය. 2020.03.02
HCLT/99/18	අධිකාරියේ සේවයේ යෙදී සිට මූල්‍ය වංචාවක් සම්බන්ධව සේවයෙන් පහ කරනු ලැබූ හිටපු අධ්‍යක්ෂ මුදල් එස්.ඒ.ඩී.ජේ. චන්ද්‍රකුමාර මහතා විසින් තමා සේවයෙන් පහ කිරීමට එරෙහිව පවරා ඇති නඩුවේ අභියාචනය	2020.01.21 දින විභාගයට නියමිතය.

2.2.4.(අ) ඉදිරියේදී කටයුතු කරනු ඇත.
2.2.4.(ආ) ඉදිරියේදී කටයුතු කරනු ඇත.
2.2.4.(ඇ) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.2.4.(ඈ) ගොනුව නිවැරදි වූ පසු ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත.
2.2.4.(ඉ) ඉදිරියේදී ඒ අනුව කටයුතු කරමි
2.3(අ)(i) ඒ අනුව නිවැරදි වනු ඇත.
2.3(අ)(ii) එසේම පවතී.
2.3(අ)(iii) නිවැරදි වී ඇත.
2.3(අ)(iv) නිවැරදි වී ඇත.
2.3(අ)(v) ඉදිරියේදී නිවැරදි වනු ඇත.
2.4(අ) ඉදිරියේදී නිවැරදි වනු ඇත.
2.4(ආ)(i) දැනට ව්‍යාපෘතිය අවසන් වී ඇත.
2.4(ආ)(ii) දැනට ව්‍යාපෘතිය අවසන් වී ඇත.
2.4(ඇ) දැනට එසේ ගෙවීම් කරමින් පවතී.
3.1 වියදම් පාලනය කිරීමට පියවර ගෙන ඇත.
4.1.1.(අ) 2020 – 2025 කාල සීමාව සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇත.
4.1.1.(ආ) අමාත්‍යාංශය මගින් SSDP ව්‍යාපෘතියේ සංවර්ධන සැළැස්ම සකස් කිරීමේ කටයුතු සෑම වර්ෂයකම සිදු කරමින් පවතී.
4.1.2.(අ) 2019 වර්ෂයේදී වැඩිවන තරුණ ජනගහනය ආකර්ශනය කර ගැනීමට අදාළ පර්යේෂණයක් ආරම්භ කර ඇත. එමගින් පාඨමාලා හඳුනා ගැනීම ද සිදු කරනු ලැබේ.
4.1.2. (ආ) දක්වන ලද ක්‍රියාමාර්ග මේ වන විටත් ක්‍රියාවට නංවා ඇත.
4.1.2. (ආ)(i) i. 2019 වර්ෂයේ පුහුණු සැලස්ම මඟින් සෑම පාඨමාලාවකම ආධුනික ධාරිතාවය ඉහල නැංවීමට කටයුතු කර ඇති අතර මාර්ගගත අධික්ෂණ ක්‍රමවේදය(Online Monitoring System) මඟින් සහ අධික්ෂණ කණ්ඩායම් විධිමත් අධික්ෂණයක් සිදු කිරීමට සැලසුම් කර ඇත.
ii. කර්මාන්තයේ නියුතු සේවකයින්ගේ නිපුණතා සංවර්ධනයට අවශ්‍ය වන පරතර පිරවීම් (Gap Filling) සඳහා සුවිශේෂී කෙටි කාලීන පාඨමාලා පවත්වා අදාල වෘත්තියේ ජාතික නිපුණතා සම්මතයේ ඇති ඒකකයන් එකක් හෝ කිහිපයක් ආවරණය කර අවසානයේ ඇගයීම් පවත්වාRecord of Achievement (ROA) සහතික පත්‍රයක් පිරිනැමීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.
4.1.2. (ආ)(ii) අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 214/02 මඟින් ආධුනික ලියාපදිංචිය , දෛනික වාර්තා පොත් , පුහුණු වන්නාගේ ප්‍රගති වාර්තා පොත් සඳහා ගාස්තු අයකිරීමට අනුමැතිය ලබා දී ඇත.
4.1.2. (ආ)(iii) 2018 වසරෙහි පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් වලට අමතරව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් මෝටර් රථ අළුත්වැඩියා නඩත්තු සහ ගොඩනැගිලි ඉදිකිරීම් යන වෙළඳපොළ වැඩි ඉල්ලුමක් සහිත ක්ෂේත්‍රයන්හි පාඨමාලාවන් සහ පුහුණු වැඩසටහන් ආරම්භ කිරීමට කටයුතු කර ඇත.
4.1.2. (ආ)(iv) 2018 වසරේ හොටෙල් හා සංචාරක, ලෝහ හා ලුහු ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි පවත්වනු ලැබූ අර්ධ කාලීන පාඨමාලාවන් සංඛ්‍යාවට වැඩි පාඨමාලාවන් සංඛ්‍යාවක් 2019 වසරේ පැවැත්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ඇත.
මීට අමතරව 2019 වසරේ විවෘත කිරීමට යෝජිත ඔරුගොඩවත්ත වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේද නව පාඨමාලාවන් 09 ක පුහුණු කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
4.1.2. (ආ)(v) මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය මඟින් සුදුසුකම්ලාභී උපදේශක වරුන් බඳවා ගැනීම පිණිස දැනුම්වත් කර ඇති අතර ආධුනික අයදුම් පත් පිළිබඳව සැලකිල්ලට ගෙන එම උපදේශන වරුන් බඳවා ගැනීමෙන් පසු පාඨමාලා ආරම්භ කිරීමේ හැකියාව පවතී.
4.1.2. (ආ)(vi) මෙම පාඨමාලාවන් පුහුණු අංශ අධික්ෂණ කණ්ඩායම්, මාර්ග ගත අධික්ෂණ ක්‍රමවේදය(Online Monitoring System)මඟින් අධික්ෂණය කර අදාල සමාලෝචන රැස්වීම් වලදී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.
4.1.2. (ආ)(vii) ආධුනික හැරයාම් අවම කර රැකියා ගත වීම් ඉහල අගයක් දක්වා ගෙන එමට කටයුතු කර ඇත.
4.1.2.(ඇ)(i) 2017 වර්ෂයේ රැකියාගත කිරීම් ඉලක්ක 8300 ක් වූ අතර සත්‍ය වශයෙන් රැකියාගත කිරීම් 6661 කි. මෙය 2016 වර්ෂයට සංඛ්‍යාත්මකව (6661-6050) 609 කින් වැඩි වී ඇත. එසේම 2018 වර්ෂයේ සිට රැකියා ඉලක්කය වනුයේ පාඨමාලා අවසන් කර රැකියා කිරීමට හැකි සියළුම පුහුණුලාභීන් වන අතර 2017 වර්ෂයේදී මීට වඩා වැඩි සංඛ්‍යාවක් මින් ඉදිරියට රැකියාගත කිරීමට කටයුතු කර ඇත.
4.1.2.(ඇ)(ii) 2017 වර්ෂය තුල විදේශ රැකියා වැඩි කර ගැනීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ දිස්ත්‍රික් මට්ටමින් පුහුණුලාභීන් සඳහා වැඩසටහන් 20 ක් මගින් ආධුනිකයින් 1924 ක් හා දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් නිලධාරීන් සඳහා වැඩසටහන් 07 ක් පවත්වා ඔවුන් දැනුවත් කර ඇත.

- එසේම විදේශ රැකියා සපයන ආයතන වෘත්තීය පුහුණු අධිකාරිය මලින් ලියාපදිංචි කර ඒ හරහා රැකියා ගත කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වේ.

- පුහුණුවේ පවතින පරතරය හඳුනා ගැනීමට විදේශගත වුවන් ගෙන්වා ගැටලු හඳුනාගැනීම.

දිස්ත්‍රික් මට්ටමින් රැකියා වෙළඳපොල පවත්වා ඒ හරහා විදේශ රැකියා සපයන ආයකන ගෙන්වා පුහුණුලාභීන් එම ආයතන වලට සෘජුවම යොමු කිරීම.

4.1.2.(ඇ)(iii) 2017 වර්ෂයේදී මෙතෙක් වැඩිම දේශීය රැකියාගත්කිරීම් සිදු වූ වර්ෂය වන අතර ඉදිරියට මීට වඩා රැකියාගත කිරීම් වැඩි කිරීමට කටයුතු කරනු ලැබේ.

4.1.2.(ඇ)(iv) මෙම ක්ෂේත්‍ර සඳහා විශේෂිත වූ අමාත්‍යාංශය හා ආයතන පවතින බැවින් ප්‍රමාණවත් ආධුනික ඉල්ලුමක් අප ආයතන වෙත නොමැති අතර පාඨමාලා යාවත්කාලීන කිරීම පිළිබඳව තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාවේ අවධානය යොමු විය යුතුයි.

4.1.2.(ඇ)(v) රැකියාගත වූවන් පිළිබඳ පසුවිපරම් තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් නිළධාරීන් හරහා සිදුකරනු ලබයි. එසේම මෙම රැකියාගත පුහුණුලාභීන්ගේ තොරතුරු 2018 වර්ෂයේ සිට “ තොරතුරු කළමණාකරණ පද්ධතිය” ට (MIS) ඇතුළත් කරනු ලැබේ.

4.1.2.(ඈ)(i) ප්‍රතිපාදන සීමාවන් මත 2019 වර්ෂයට පර්යේෂණ අධ්‍යනයන් 02ක් ආරම්භ කර ඇත

4.1.2.(ඈ)(ii) වෘත්තීය පුහුණුව හදාරන්නන් සම්බන්ධව පර්යේෂණ අධ්‍යනයන් 2019 වර්ෂයේදී ආරම්භ කරනු ලැබීය.

4.1.2.(ඈ) (iii) ආයතනික කාර්යය සාධනයට අදාළ පර්යේෂණ අධ්‍යනයන් දිගින් දිගටම පවත්වනු ලැබේ

4.1.2.(ඈ) (iv) ආයතනික අවශ්‍යතාවය මත ශක්‍යතා අධ්‍යන සිදු කිරීමට පැවරේ. ඒ අතරතුර ප්‍රතිපාදන සීමාවන් යටතේ පර්යේෂණ කාර්යයන් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලැබේ

4.1.2.(ඉ) ඉඩම් පුනරුත්ථාපනය සඳහා වෙනු කරනු ලබන ප්‍රතිපාදන වලට අනුකූල ලෙස වියදම් සීමාව නොඉක්මවා කටයුතු කිරීමට දැනුවත් කර ඇත.

4.2(අ) කම්කරු ආඥා පනත් අනුකූලව කටයුතු කරන ලෙස අදාළ දිස්ත්‍රික් ප්‍රධානීන් හා සේවාව ලබා දෙන ආයතනයද දැනුවත් කර ඇත.

4.2(ආ) 2019.12.31 දින නැවත රක්ෂණ සමාගම වෙත ලිපියකින් දැනුවත් කරන ලදී.

4.2(ඇ) සියළු ගෙවීම් සිදු කර ඇත.

4.3(අ) අංක KI-2564 දරණ වාහනය මේ වන විට බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දී ඇති අතර උපසභාපති වෙත අංක CBI-8163 දරණ වාහනය ලබා දී ඇත.

4.3(ආ) අංක KI-3601 දරණ වාහනය මේ වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දී ඇති අතර සභාපති වෙත අංක CBI-1166 දරණ වාහනය ලබා දී ඇත.

4.3(ඇ) ඒ අනුව නිවැරදි වනු ඇත.

4.3(ඈ) නිවැරදි වී ඇත.

4.4(අ) පත් කරන ලද කමිටුව මගින් මෙම බස් රථය මෝටර් රථ කාර්මික පාඨමාලා පුහුණු කටයුතු සඳහා ලබා දීමට තීරණය කර ඇත.

4.4(ආ) අදාල බස් රථය මේ වන විට ප්‍රධාන කාර්යාලය වෙත ගෙන ඒමට පරිපාලන අංශය විසින් කටයුතු කර ඇත.

4.5(අ) ප්‍රධාන අභ්‍යන්තර විගණක බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු බඳවා ගැනීම් සඳහා පුවත්පත් දැන්වීම් පළ කළද සුදුසුකම්ලත් නිළධාරීන් සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වී නොතිබුණි

4.5(ආ) නිවැරදිව දත්ත පවත්වා ගෙන යනු ලබන අතර විධිමත් පරිදි බඳවා ගැනීම් කටයුතු සිදු කරනු ලැබේ. බඳවා ගැනීම් පටිපාටියේ සුදුසුකම් සංශෝධනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

5.1 අදාළ වැඩසටහන් සඳහා අධිකාරියේ නියෝජිතයින් වන පරිදි නිළධාරීන් ද සහභාගි කර අදාළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී

6.1 වාර්ෂික විගණන කටයුතු සැළසුම් සිදු කර සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

6.2.1.(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 6.3.3 ප්‍රකාරව කටයුතු සිදු කරනු ලබන අතර වර්තමානයේ මිල කැඳවුම්පත් විවෘත කිරීම ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් සිදු කරනු ලබයි.

6.2.1.(ආ) මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකර 2017.10.11 දින භාරගත් අතර එතැන් පටන් 2018.10.11 දින දක්වා නඩත්තු කාලය විය. එම කාලය තුළද මතු වූ අඩුපාඩු අදාළ කොන්ත්‍රාත් ආයතනය වෙතින් පිළිසකර කරගන්නා ලද අතර ඉන් අනතුරුව රැඳවුම් මුදල් (Retersian Money) සඳහන් කර ගෙවා ඇත. 2017.10.11 දින සිට මෙම ගොඩනැගිල්ල පුහුණු කටයුතු සඳහා යොදාගෙන ඇත.

6.2.1.(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 2.7.5 අනුව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් පත් කිරීම අමාත්‍යාංශ ලේකම් විසින් සිදු කරනු ලබයි.

6.2.1.(ඈ)/ 6.2.1.(ඉ)/ 6.2.1.(ඊ) නැවත මිල ගණන් කැඳවා 2019.09.12 දින සිට මෙම ආපනශාලාව නව සේවා සැපයුම්කරුවෙකු වෙත පවරා ඇත.

6.2.2.(අ) 6.2.1 පරිදි මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ නිමකර අධිකාරිය වෙත භාරදී එහි නඩත්තු කාලය (වසර 1) අවසන්ව රැඳවුම් මුදල් ද නිදහස් කර ඇත. මේ වන විට ගොඩනැගිල්ල භාවිතා කිරමින් පවතී.

6.2.2.(ආ) මෙම ව්‍යාපෘතිය 2019 වසරේ නැවත ආරම්භ කිරීමට සැළසුම් කර තිබූ නමුත් (ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදන මත) එම වැඩසටහන වෙතින් 2019 වසර සඳහා ලැබෙන ප්‍රතිපාදන සීමාකිරීම නිසා එම වසර තුළ සැළසුම් කළ ආකාරයට මෙම කාර්යය ඉටු කළ නොහැකි විය.

නැවත 2020 වසර සඳහා ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රමුඛතාවය ලබාදී ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා මේ වන විට සැළසුම් කර ඇත. එහෙත් පළමු කාර්තුව තුළ තවමත් ප්‍රතිපාදන ලැබී නොමැති අතර, එම ප්‍රතිපාදන අනුමත වූ විට මෙම ව්‍යාපෘතිය දෙවන අදියර ආරම්භ කිරීම සඳහා කටයුතු කරමි.

6.2.2.(ඇ)(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 2017.10.03 දිනැති Supplement – 14 හි 8.13.4 –A යටතේ 10% ක අවිනිශ්චිත මුදල් සීමාව තුළ ඇති විචල්‍යයන් ආයතන ප්‍රධානියාට අනුමත කළ හැකි හෙයින් විශේෂ අවස්ථා වලදී හැර ආයතන ප්‍රධානියා විසින් එම අනුමැතීන් ලබා දෙනු ඇත.

6.2.2.(ඇ)(ii)/ 6.2.2.(ඇ)(iii) පෙර දැක්වූ ආකාරයට සාධාරණ හේතූන් මත 2018.01.31 දින දක්වා කොන්ත්‍රාත් කාල දිගුවක් ලබාදී ඇත. එහෙත් දිගින් දිගටම ප්‍රමාද වන හෙයින් 2018.10.10 කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලදී. ඉන්පසු 2019 වසරේ නැවත මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස අළුතින් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කරවන ලදී.

එම කොන්ත්‍රාත්තුවේ අවසාන ගෙවීම් පත මේ වන තෙක් ගෙවා නොමැති අතර එම බිල්පත ගෙවූ පසු පෙර කොන්ත්‍රාත් ආයතනයෙන් අයවිය යුතු මුදල් අයකරගෙන එම කොන්ත්‍රතාත් ආයතනයේ රැඳවුම් මුදල් නිදහස් කොට ගෙවීමට කටයුතු කරමි.

6.2.2. (ඈ) (i) දැනට මෙම හොටල් පාසල අදියර කිහිපයකදී නිමකර ඇති අතර මේ වන විට එහි අවසාන අදියර යටතේ ගෑස්නල පද්ධතිය ස්ථාපනය කරමින් පවතී. එහෙත් අධිකාරියේ නේවාසිකව කරනු ලබන රැස්වීම් හා වැඩසටහන් සඳහා තිබෙන පහසුකම් යටතේ මෙම හෝටල් පුහුණු ආයතනය භාවිතයට ගනු ලබන අතර ගෑස් නල පද්ධතිය ඇතුළු අවශ්‍ය අනෙකුත් සුළු අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු ක්‍රමානුකූලව ක්‍රියාත්මක වන හෝටලයක් ලෙස පවත්වමින් අප ආධුනිකයින් හට වැඩිදුර පුහුණුවටද අවස්ථාවක් ලබාදීමට කටයුතු කරමි.

6.2.2.(ඈ)(ii) දැනට මෙම හොටල් පාසල අදියර කිහිපයකදී නිමකර ඇති අතර මේ වන විට එහි අවසාන අදියර යටතේ ගෑස්නල පද්ධතිය ස්ථාපනය කරමින් පවතී. එහෙත් අධිකාරියේ නේවාසිකව කරනු ලබන රැස්වීම් හා වැඩසටහන් සඳහා තිබෙන පහසුකම් යටතේ මෙම හෝටල් පුහුණු ආයතනය භාවිතයට ගනු ලබන අතර ගෑස් නල පද්ධතිය ඇතුළු අවශ්‍ය අනෙකුත් සුළු අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු ක්‍රමානුකූලව ක්‍රියාත්මක වන හෝටලයක් ලෙස පවත්වමින් අප ආධුනිකයින් හට වැඩිදුර පුහුණුවටද අවස්ථාවක් ලබාදීමට කටයුතු කරමි.

6.2.2.(ඈ)(iii) මෙම හොටල් පුහුණු පාසලේ ඉදිකිරීම් කටයුතු 2019 වසරේ අවසාන කළ අතර 2020 ජනවාරි මස සිට සැළසුම් කළ ආකාරයටම පාඨමාලා 05 ක පුහුණු කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

6.2.2.(ඉ) ආදාල පුහුණු උපකරණ ගබඩාකිරීමේ පහසුකම් නොමැති වීම හේතුවෙන් කොග්ගල, අහංගම, හික්කඩුව පුහුණු මධ්‍යස්ථාන වල තාවකාලිකව ගබඩා කිරීමට කටයුතු කර ඇති අතර ඇඳ ඇතිරිලි තුවා වැනි අයිතම අහංගම හොටල් පාසලේහි වට්ටෝරු පොත් වලට ඇතුලත් කර ඇත.

6.2.2.(ඊ) වර්තමානය වන විට හෝටලයක් ලෙස පවත්වාගෙන යයි.

6.3(අ) ඒ අනුව කටයුතු කර ඇත.

6.3(ආ) මෙම ප්‍රග්ධන ව්‍යයදම් හා පුනරාවර්ථන ව්‍යයදම් සිදු වන විචලතාවයන් අවම කිරීමට කටයුතු කර ඇත

6.4(අ) දීර්ඝ කාලයක් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීමේ කටයුතු ප්‍රමාද වූ බැවින් මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම කරුණ ඉදිරිපත් කොට තීරණයක් ගැනීමට නියමිතය.

6.4(ආ) නිවැරදි වී ඇත.

6.4(ඇ) විධිමත් පරිදි පරීක්ෂණය පවත්වා අදාල චුදිත නිළධාරීන් සඳහා විනය නියෝග ක්‍රියාත්මක කර ඇත.

6.4(ඈ) මූල්‍ය අක්‍රමිකතාවන්ට එරෙහිව වැඩ තහනම් කල නිලධාරියාට ගෙවන ලද වැටුප් අය කර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ පවරා ඇති DMR/1029/2014 දරණ නඩුව 2020.03.02 විභාගය සඳහා නියමිතය.

මෙම නිලධාරියා විසින් කම්කරු උසාවියේ පවරා තිබූ 2/AD/3668/2013 නඩුවේ නියෝගය ප්‍රකාරව ඔහු වෙත ගෙවන ලද රු: 32,27736.75 ක මුදල නැවත අධිකාරිය වෙත අය කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් කොළඹ මහාධිකරණයේ HCLT/99/18 අභියාචනා නඩුවක් ගොනු කර ඇත. එය 2020.01.21 දින විභාගය සඳහා නියමිතය.

7(අ) විධිමත් පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇත. බඳවාගැනීම් පටිපාටියේ සුදුසුකම් සංශෝධනයට ඉදිරිපත් කර ඇත. එමගින් ගැටළු විසඳාගැනීමට කටයුතු කර ඇත.

7(ආ) ඒ අනුව නිවැරදි වනු ඇත.

7(ඇ) ඒ අනුව නිවැරදි වනු ඇත.

7(ඈ) නිවැරදි කර ඇත.

7(ඉ) කොන්ත්‍රාත්කරුවන් වෙත අදාළ උපදෙස් හා සුරක්ෂණ කල් ඉකුත්වීමට පෙර අදාළ කොන්ත්‍රාත් ලබාදීමටත් කටයුතු කරන ලෙස දැනුම් දී ඇති අතර එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා නිළධාරීන් කණ්ඩායම් වශයෙන් අධීක්ෂණය කිරීමට යොදවා ඇත.

7(ඊ) කාර්යය සාධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග යොදවා ඇත.